

කාර්යසාධන වාර්තාව - 2022

வருடாந்த செயல்திறன் அறிக்கை - 2022

PERFORMANCE REPORT - 2022

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

இலங்கை இராணுவம்

Sri Lanka Army

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2022

අන්තර්ගතය

පිටු අංකය

පරිච්ඡේදය 1 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

* හැඳින්වීම 1 - 1
* ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු 1 - 1
* ප්‍රධාන කාර්යන් 1 - 1
* සංවිධාන ව්‍යුහය 1 - 3

පරිච්ඡේදය 2 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

* ප්‍රගතිය 2 - 1
* නව්‍ය තාක්ෂණික නැඹුරුව 2 - 8
* ඉදිරි දැක්ම 2 - 10
* ආයතනයේ ප්‍රගතිය 2 - 12
* ක්‍රියාත්මක කර ඇති සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති 2 - 15

පරිච්ඡේදය 3 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

* 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය 3 - 1
* මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 3 - 3
* මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 3 - 5
* මූල්‍ය ප්‍රකාශ සටහන් 3 - 7
* ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 3 - 8
* වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 3 - 9
* 2022 වර්ෂයේදී වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් වෙනුවෙන් යුද්ධ හමුදාව වෙත ලබාදුන් ප්‍රතිපාදන හා ඊට අදාළ වියදම් විස්තර 3 -10
* මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 3 - 13
* විගණකාධිපතිවරයාගේ වාර්තාව 3 - 13

පරිච්ඡේදය 4 - කාර්යසාධන දර්ශක

* ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 4 - 1

පරිච්ඡේදය 5 - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

* හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 5 - 1

පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ

* සේවක සංඛ්‍යා කළමනාකරණය 6 - 1
* ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් 6 - 1
* මානව සම්පත් සංවර්ධනය 6 - 2

පරිච්ඡේදය 7 - අනුකූලතා වාර්තාව

* අනුකූලතා වාර්තාව - යුද්ධ හමුදාව 7 - 1

පරිච්ඡේදය
1
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දේශයේ ඒකීයත්වය, ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩත්වය සුරැකීමෙහි ප්‍රධාන වගකීමෙන් බැඳුණු ගොඩබිම් ක්‍රියාන්විත සඳහා වන විශාලතම හමුදා සේවයයි. තම රාජකාරි ඉහළ වෘත්තීමයභාවයකින් යුතුව ඉටු කරමින් සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීමට සහ රටේ ආරක්ෂාව සහ සෙසු කටයුතුවලට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අසමසම දායකත්වයක් දරනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු



1.3 ප්‍රධාන කාර්යන්

සන්නද්ධ හමුදාවන්හි විශාලතම බලකාය/ හමුදාව වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව ආරක්ෂා කරගැනීමට සහ එය පිළිගැනීමට බැඳී සිටියි. අභ්‍යන්තරික හා බාහිර තර්ජන හමුවේ මාතෘ භූමියෙහි ගෞරවය, ඒකීයත්වය, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය පවත්වාගෙන යාමේ අරමුණින් රාජකාරී ඉටු කරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදිය:

(1) අභ්‍යන්තරික හා බාහිර ගැටුම්වලින් මාතෘ භූමිය සුරක්ෂිත කරමින් එහි ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය හා ජාතික සමඟිය ආරක්ෂා කිරීම, වත්මන් තර්ජන වලට සහ කලහකාරී ක්‍රියාවලට එරෙහිව එය වැළැක්වීමේ බලකායක් ලෙස කටයුතු කිරීම.

(2) අභ්‍යන්තර තර්ජන හමුවේ කටයුතු කිරීම සඳහා රජයේ අනුබද්ධිත ආයතන වලට සහාය වීම සහ ජාතික ව්‍යසන, ආපදා හා හදිසි අවස්ථාවන්හි දී සිවිල් අධිකාරීන්ට සහයෝගය ලබාදීම.

(3) සම්භාවිතාව සහිත තර්ජනයන් දූරදර්ශීව හඳුනා ගැනීම හා ඒ සඳහා ක්‍රියාකාරී පිළිවෙත් යොදා ගැනීම.

(4) බහු නිපුණතා සහිත මනාව සූදානම් වූ හටපිරිස් විෂමාකාර තර්ජනයන් වැළැක්වීම උදෙසා පවත්වා ගැනීම.

(5) පුහුණුව තුළින් යුධමය හා සාමකාමී වාතාවරණයන් තුළ අවශ්‍ය ක්‍රියාන්විත හැකියාවන් පවත්වාගෙන යෑම.

(6) පුර්ණ ගැටුම්කාරී ස්වභාවයන් හි සියලු ආකාර ක්‍රියාන්විතයන්හි නිරතවීමට වගබලා ගැනීම.

(7) ආපදා තත්ත්වයන් තුළ එම තත්ත්වයන්ගෙන් මිදීමටත් සහන සැපයීමත් උදෙසා රාජ්‍ය අංශයේ බලධාරීන් හට සහාය වීම.

(8) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියට හා අවබෝධතා ගිවිසුම්වලට අනුකූලව සාමසාධක රාජකාරීන්හි නිරත වීම.

(9) සිවිල් ජන සමාජයෙහි පරිපාලනය අඩාල වන අන්දමින් ඇතිවිය හැකි නොසන්සුන් වාතාවරණ, කැරළි ස්වභාවයන් තුළ නීතිය හා සාමය පවත්වා ගැනීම උදෙසා සහාය ලබාදීම.

(10) රාජ්‍ය අනුග්‍රහය යටතේ ආරම්භ කරන ලද ජාතිය ගොඩනැංවීමේ වැඩසටහන් සඳහා සහාය ලබාදීම.

(11) අවශ්‍ය වූ අවස්ථාවන්හි දී විදෙස් රාජ්‍යයන් සඳහා මානුෂික ආධාර ලබාදීම.

1.4 සංවිධාන ව්‍යුහය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථාන සංවිධාන ව්‍යුහය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කේෂ්ත්‍ර සංවිධාන ව්‍යුහය

යුද්ධ හමුදා මූලස්ථානය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන

යුද්ධ හමුදා මූලස්ථානය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුහුණු සංස්ථා

යුද්ධ හමුදා මූලස්ථානය



පරිච්ඡේදය
2
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 <u>ප්‍රගතිය</u>

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව එහි ආරම්භයේ සිටම මාතෘ භූමියට එල්ල විය හැකි ඕනෑම ආකාරයක බාහිර හා අභ්‍යන්තර තර්ජනවලට එරෙහිව ක්‍රියාකරන විශ්වාසවන්තම හා ප්‍රමුඛතම හමුදාවයි. ජාතික ප්‍රගමනය වෙනුවෙන් විවිධාකාර අයුරින් දායකත්වය දක්වා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, සාම්ප්‍රදායික හමුදාවක කාර්යභාරයෙන් ඔබ්බට ගොස් ජාතියේ ආරක්ෂකයා ලෙස තම මූලික සන්නද්ධ රාජකාරිය ඉටුකර මව්බිමට ගෞරවයක් ලබා දී ඇත.

2. ජාතික ආරක්ෂාව, ආපදා තත්ත්වයන්ට මුහුණදීම, කොවිඩ් වසංගතය හා ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති ආදී ක්ෂේත්‍ර ගණනාවක් තුළ පැවරුණු වගකීම් හා රාජකාරීන් නිසි ආකාරයෙන් ඉටුකරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කීර්තිමත් මෙහෙවරක නියුතුව සිටියි.

3. වර්තමානයේ රජයේ ප්‍රතිපත්තීන්ට අනුව රට සංවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාන්විතයේ විශේෂිත කාර්යභාරයක් යුද්ධ හමුදාවට පැවරී ඇත. ඒ අනුව යුද්ධ හමුදාව ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති රාශියක් සාර්තකව අවසන් කරමින් පවතියි. වෙනස්වීම හා අනුගතවීම මූලධර්මය අනුව යමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් එළිදැක්වූ '**2020 - 2025 යුද්ධ හමුදා පස් අවුරුදු මූලෝපායික සැලැස්ම**' අනුව නවීන තත්ත්වයන් හා කාලෝචිත අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට සමඟාමීව යුද්ධ හමුදාව යාවත්කාලීන කිරීම ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තම භටපිරිස් නිසිලෙස කළමනාකරණය කරගනිමින් පහත සඳහන් ආයතන නවතමයෙන් ස්ථාපිත කරන ලද අතර, එම ආයතනයන්හි කාර්යන් හා කාර්යභාරයන් සංක්ෂිප්තව පහත පරිදි වේ.

ඇ. <u>**යුද්ධ හමුදා මූලස්ථාන බලසේනා මූලස්ථානය.**</u> යුද්ධ හමුදාධිපතිතුමාගේ සමීප ආරක්ෂාව සඳහා අවශ්‍ය ආරක්ෂක ක්‍රමවේද සැලසුම් කිරීම, වර්ධනය සහ ක්‍රියාවට නැංවීම, යුද්ධ හමුදා මූලස්ථානයට ඇතිවිය හැකි අභ්‍යන්තර සහ බාහිර තර්ජන වැළැක්වීම සහ ආරක්ෂක අමාත්‍යාංශයේ සහ යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් අනුව සංවිධානය කරනු ලබන සියලුම උත්සව කටයුතු සඳහා සහාය ලබාදීම වන අතර, මෙම බලසේනා මූලස්ථානයෙහි කාර්යන් පහත පරිදි වේ.

(1) යුද්ධ හමුදාධිපතිතුමන් සඳහා සමීප ආරක්ෂාව සැපයීම.

(2) යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රය වෙත එල්ලවිය හැකි අභ්‍යන්තර සහ බාහිර තර්ජන හඳුනා ගැනීම සහ වැළැක්වීම.

(3) යුද්ධ හමුදා මූලස්ථානයට එල්ලවන සියලුම ආකාරයේ තර්ජන සඳහා යුද්ධ හමුදා මූලස්ථාන බලසේනාව සංග්‍රාමිකව සුදානම්ව තැබීම.

(4) ආරක්ෂක අමාත්‍යාංශයේ සහ යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස්වලට අනුව සංවිධානය කරනු ලබන සියලුම උත්සව සඳහා සහාය ලබාදීම.

(5) අනවසර පුද්ගලයන්, වාහන සහ උපකරණ යුද්ධ හමුදා මූලස්ථානය වෙත ඇතුළුවීම වැළැක්වීම.

(6) මේජර් ජෙනරාල් සහ ඉන් ඉහළ නිලයන් සඳහා සියලුම නොමිලේ නිකුත් කිරීම් සිදුකිරීම.

(7) රාජ්‍ය අවමංගල්‍ය උත්සව හා මේජර් ජෙනරාල් සහ ඉන් ඉහළ නිලයන්ගේ අවමංගල්‍ය කටයුතු සිදුකිරීම සම්බන්ධීකරණය කිරීම.

(8) ආරක්ෂක අමාත්‍යාංශය සහ යුද්ධ හමුදා මූලස්ථානය විසින් සංවිධානය කරනු ලබන සියලුම උත්සව අවස්ථාවන් සඳහා අවශ්‍ය භාණ්ඩ ගබඩා කරනු ලබන ගබඩාවන් නියමිත පරිදි නඩත්තු කිරීම.

(9) යුද්ධ හමුදා මූලස්ථානයට අයත් සියලුම ශාඛා/අධ්‍යක්ෂ මණ්ඩල සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ සැපයීම මඟින් එම ආයතනයන්හි මනා ක්‍රියාකාරීත්වය සහතික කිරීම.

ආ. **<u>ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම)</u>**. ඵලදායී හා කාර්යක්ෂම හට කාර්ය සම්පාදන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම මඟින් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශය තුළ ක්‍රියාන්විත හා ක්‍රියාන්විත නොවන අවශ්‍යතාවයන් ඉටු කිරීම හා ඒ සඳහා හට කාර්ය සම්පාදන ඒකක නිවැරදිව යෙදවීම ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම) කාර්යභාරය වන අතර මෙහි කාර්යයන් පහත පරිදි වේ.

(1) ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බල ප්‍රදේශය තුළ ස්ථාපිත යුද්ධ හමුදා කඳවුරු වෙත පාලන හා හට කාර්ය සම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම හා එය ක්‍රියාවේ යෙදවීම සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති වෙත වගකිව යුතු වේ.

(2) ක්‍රියාන්විත හා ක්‍රියාන්විත නොවන රාජකාරීන්ට ප්‍රථම සහ එම ක්‍රියාන්විත අතරතුරදී අවශ්‍ය හට කාර්ය සම්පාදනය සඳහා අපේක්ෂිත සැලසුම් සකස් කිරීම.

(3) සෑම ක්ෂේත්‍ර මූලස්ථානයන් සඳහා ක්‍රියාන්විතයට පෙර, ක්‍රියාන්විතයේ හා ක්‍රියාන්විතයෙන් පසු අවශ්‍ය හට කාර්ය සම්පාදන අවශ්‍යතා සැපයීම.

(4) යුද්ධ හමුදා මූලස්ථානය/ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) මඟපෙන්වීම යටතේ හට කාර්ය සම්පාදන ආයතන සඳහා සුදුසු නිර්ණායක ලබාදීම.

(5) ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ පාලනය වන හට කාර්ය සම්පාදන ආයතන/ස්ථානයන්හි ප්‍රමාණවත් පරිදි තොග නඩත්තු කටයුතු සිදුකිරීම පිළිබඳ සහතික කිරීම.

(6) බලප්‍රදේශය සඳහා අවශ්‍ය හට කාර්ය සම්පාදන අවශ්‍යතා සපුරාලීම සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල සමඟ සම්බන්ධීකරණය වීම.

(7) යුද්ධ හමුදා මූලස්ථානයේ/ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හි නිර්ණායකයන්ට අනුව හට කාර්ය සම්පාදන ඒකක/උප ඒකක සහ ආයතන ප්‍රදේශයන් තුළ නිවැරදිව ස්ථානගත කිරීම.

(8) ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) තුළ ඇති හට කාර්ය සම්පත් නිවැරදිව බෙදාදීම සහ සම්බන්ධීකරණය කිරීම.

(9) අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ මූලස්ථාන හා ප්‍රවාහන ආයතන සමඟ සම්බන්ධීකරණය වීම.

(10) අවශ්‍ය අවස්ථාවන්හිදී හට කාර්ය සම්පාදන අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා ප්‍රදේශයේ සිවිල් ආයතන සමඟ සම්බන්ධ වීම.

(11) අක්‍රමිකතාවයන් හා විෂමතාවයන් වළක්වා ගැනීම හා හඳුනා ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(12) කාර්යක්ෂමව හා ඵලදායි හට කාර්ය සම්පාදන ක්‍රියාවලියක් බලප්‍රදේශය තුළ පවත්වාගෙන යාම සඳහා හට කාර්ය සම්පාදන ආයතන කාලීන පරීක්ෂාවට ලක් කිරීම, ගිණුම් පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා තොග පරීක්ෂාවන් සිදුකිරීම.

(13) සිවිල් ආයතන හා හට කාර්ය සම්පාදන ඒකක හා ආයතනයන්හි ආරක්ෂාව සබැඳි කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඇ. **<u>පර්යේෂණ සංකල්ප සහ මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය</u>**. ගොඩබිම් යුද්ධයේ සියලුම න්‍යායික හා තාක්ෂණික අංශයන්හි පර්යේෂණ විශ්ලේෂණ, නව සොයාගැනීම්, න්‍යායාත්මක ප්‍රකාශන සහ යුද්ධ හමුදාව සඳහා අදාළ පුහුණු සංකල්ප සංවර්ධනය කිරීම, සකස් කිරීම, බෙදාහැරීම සහ අධීක්ෂණය කිරීම පර්යේෂණ සංකල්ප සහ මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වන අතර මෙහි කාර්යයන් පහත පරිදි වේ.

(1) පර්යේෂණ, සංකල්ප, සිද්ධාන්ත, නව උත්පාදන සහ පුහුණු අධීක්ෂණ අංශවලට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපති වෙත උපදෙස් ලබාදීම.

(2) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සටන් බලයේ සංකල්පීය අංගය සම්බන්ධීකරණය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම සහ සියලු අභ්‍යන්තර හා බාහිර සංවිධාන සහ ආයතන සම්බන්ධීකරණය කරමින්, ගොඩබිම් යුද්ධයට අදාළ සියලු න්‍යායික කරුණු පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ සංකල්පගත කිරීම.

(3) ගෝලීය/කලාපීය/උප කලාපීය සහ දේශීය තත්ත්වයන් පිළිබඳ පර්යේෂණ/ සිද්ධි අධ්‍යයනයන් පැවැත්වීම සහ භාවිතය පිළිබඳ විශ්ලේෂණ පත්‍රිකා සකස් කිරීම.

(4) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය, අනෙකුත් ආරක්ෂක අංශ සහ වෙනත් පාර්ශවයන් සමඟ ඒකාබද්ධ මූලධර්ම සංවර්ධනය සහ සමාලෝචනය කිරීමේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ ගොඩබිම් සටන් කණ්ඩය නියෝජනය කිරීම, එහි අන්තර් ක්‍රියාකාරීත්වය සහ මනා සම්බන්ධතාවය සහතික කිරීම.

(5) ගෝලීය සහ මෙරට හමුදා ඉතිහාසය අධ්‍යයනය කිරීම, සමකාලීන සහ අනාගත ආරක්ෂාව සපුරාලීම සඳහා උපාය මාර්ගික මෙහෙයුම් සහ උපායශීලී මට්ටම්වලින් යුධ සටන් සඳහා සංකල්ප/ මූලධර්ම ක්‍රියාවට නැංවීම, සැකසීම, ව්‍යාප්ත කිරීම සහ අධීක්ෂණය සඳහා දැනුම ලබාගැනීම සබැඳිව වගකීම දරයි.

(6) දැනුමෙහි අඩුපාඩු හඳුනාගෙන, අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලිකගේ අනුදැනුම මත පර්යේෂණ, කාලානුරූපී සමාලෝචනය, සංවර්ධනය සහ අනුමත කිරීම, මූලධර්ම ප්‍රකාශයට පත් කිරීම සහ විශේෂිත ක්ෂේත්‍ර අත්පොත්, පුහුණු ප්‍රකාශන, පුහුණු විෂයමාලා සහ වාරණ විෂයමාලා විධිමත් කිරීම.

(7) යුධ මෙහෙයුම්, වෙනත් මෙහෙයුම්, එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සහ සිවිල් ජනතාව වෙත ආධාර සැපයීම්වලදී උගත් පාඩම් සහ අත්දැකීම් විශ්ලේෂණය කිරීම සහ දේශීය මෙහෙයුම්/විදේශීය මෙහෙයුම් පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සහයෝගයෙන් පුහුණු සංකල්ප සංවර්ධනය කිරීම සඳහා වගකීම දැරීම.

(8) මූලධර්ම සංකල්ප භාවිතය සහතික කිරීම සඳහා හමුදා උපාය මාර්ග, මූලධර්ම සහ උපක්‍රම, ශිල්පීය ක්‍රම සහ ක්‍රියා පටිපාටි, පුහුණු විෂයමාලා සහ විෂයමාලා සැකසීමට හැකි වන පරිදි ඒකාබද්ධ හමුදා සහ ඒකාබද්ධ යුද සංකල්ප පිළිබඳ අඛණ්ඩ පර්යේෂණ පැවැත්වීම.

(9) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ කෘතිම බුද්ධිය, රොබෝ තාක්ෂණය, විද්‍යුත් සංග්‍රාම, සයිබර්, රේඩාර්, පරිගණක තාක්ෂණය, චන්ද්‍රිකා, ගෝලීය තොරතුරු පද්ධතිය, සිතියම්කරණය, නිරීක්ෂණය සහ නාවික පද්ධති ඇතුළු ඉලෙක්ට්‍රොනික, සන්නිවේදන සහ පරිගණක පද්ධති සම්බන්ධ නවෝත්පාදන පර්යේෂණ සහ සංවර්ධනය කිරීම.

(10) යුද්ධ හමුදාවේ සියලු වර්ගවල වාහන, සුළු අවි සහ පතරොම්, නොපෙනෙන ඉලක්කපත් සඳහා වෙඩි තැබීමේ ක්‍රම සහ යුධ උපකරණ, පුපුරණ ද්‍රව්‍ය, ටැංකි ආයුධ, මාරාන්තික නොවන ආයුධ පද්ධති, මිසයිල පද්ධති සහ වෙනත් නවීන යුධ උපකරණ ඇතුළු වෛද්‍ය උපකරණ සම්බන්ධ නව සොයාගැනීම්, පර්යේෂණ සහ සංවර්ධනය සිදුකිරීම.

(11) විද්‍යුත්, යාන්ත්‍රික, ඉලෙක්ට්‍රොනික, මෙකාට්‍රොනික්, කෘෂිකර්මය, සිවිල් සහ සාමාන්‍ය ඉංජිනේරු ඇතුළු ව්‍යවහාරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බාහිර විශ්ව විද්‍යාල සහ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් සහ සහයෝගයෙන් පර්යේෂණ පැවැත්වීම.

(12) සියලුම අභ්‍යන්තර පුහුණු ආයතන සහ බාහිර පුහුණු ආයතන මඟින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූලධර්ම සංවර්ධන අරමුණු සඳහා සිදුකරන තාක්ෂණික හා තාක්ෂණික නොවන පර්යේෂණ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීම සහ පර්යේෂණ අධීක්ෂණය කිරීම.

(13) පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන් සමකාලීන සහ අනාගත තර්ජන සහ අභියෝග අවබෝධ කර ගැනීම සඳහා යුද හමුදා මට්ටමේ ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස සහ සම්මන්ත්‍රණ සැකසීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ සංවර්ධනය කිරීම.

(14) අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලිකගේ මඟපෙන්වීම යටතේ පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්බන්ධතාවයෙන් ශ්‍රී ලංකාව සහ විදේශීය හමුදා අතර පුහුණු ක්ෂේත්‍රයේ 'මාණ්ඩලික සාකච්ඡා' සහ එවැනි ඕනෑම කටයුත්තක් සඳහා යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

(15) පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව රෙජිමේන්තු පුහුණු පාසල්/ස්ථාන සහ ගුවන් සංග්‍රාමික පුහුණු පාසල ඇතුළු සියලුම හමුදා පුහුණු ආයතනවල පුහුණු ක්‍රියාකාරකම් සඳහා න්‍යායාත්මක සංකල්ප යොදාගැනීම අධීක්ෂණය කිරීම සහ ඉගැන්වීම්, සංකල්ප, පුහුණු විෂය පථයන් සහ වාරණ විෂයමාලා තක්සේරු කිරීම සහ සංශෝධනය කිරීම.

ඈ. **<u>ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු ජීව වෛද්‍ය ස්වාධීන වැඩපළ</u>**.

හමුදා වර්යා නියෝග 18/2018 අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය විසින් භාවිතා කරනු ලබන සියලුම ජීව වෛද්‍ය උපකරණ අළුත්වැඩියා හා නඩත්තු කිරීම වන අතර මෙහි කාර්යයන් පහත පරිදි වේ.

(1) සියලුම යුද්ධ හමුදා රෝහල්හි භාවිතා කරනු ලබන ජීව වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව, නඩත්තු කිරීම, සේවා කටයුතු සිදුකිරීම, සීරුමාරු කිරීම සහ අයෝග්‍ය කිරීම.

(2) යුද්ධ හමුදා රෝහල් තුළ ඇති වෛද්‍ය වායු පද්ධති අලුත්වැඩියාව හා නඩත්තු කිරීම.

(3) වෛද්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා පිරිවිතර සකස් කිරීම සහ තාක්ෂණික සහාය ලබාදීම.

(4) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කාර්මිකයින් හට ජීව වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව පිළිබඳව දැනුම ලබාදීම.

(5) කාලීන අවශ්‍යතාවයන්ට අනුව ජීව වෛද්‍ය උපකරණ නවෝත්පාදන සිදුකිරීම.

(6) යුද්ධ හමුදා රෝහල කොළඹහි සියලුම වායුසමීකරණ, ශීතකරණ, රෝහල් නඩත්තු උපකරණ නඩත්තුව හා සේවා සිදු කිරීම.

ඉ. **<u>6 ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශුසම්පත් බලකාය/ 5 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශුසම්පත් බලකාය</u>**. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දියුණුව හා උන්නතිය සඳහා ඵලදායි හා සක්‍රීය සේවය ලබා දෙමින් කෘෂිකර්මාන්තය නහාසිටුවීමෙන් රට තුළ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම. එමෙන්ම සියලුම යුද්ධ හමුදා ගොවිපළවල් ඵලදායි මට්ටමකින් පවත්වාගෙන යන බවට සහතික වීම සහ හමුදාව තුළ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල ස්වයංපෝෂිත භාවය ලබාගැනීම සඳහා මෙම ගොවිපළවල ඵලදායිතාව ඉහළ නැංවීමට සෑම උත්සාහයක්ම දරන බවට සහතික කිරීම මෙම බලකායන්හි කාර්යභාරය වන අතර එම බලකායන්හි කාර්යයන් පහත පරිදි වේ.

(1) කෘෂිකාර්මික හා පශුසම්පත් නිෂ්පාදන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සැපයීම.

(2) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ ස්ථාපිත අනෙකුත් ගොවිපළ කටයුතු සඳහා දායකත්වය ලබාදීම.

(3) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකාර්මික ව්‍යාපෘති හා ගොවිපළ කණ්ඩායම් සහ පශුසම්පත් කණ්ඩායම යන කණ්ඩායම් යම්කිසි කාර්යයක් සඳහා යොමු කිරීමේ දී ස්වාධීන කණ්ඩායමක් ලෙස ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට ක්‍රියා කිරීම.

(4) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමඟ ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාපෘති කෘෂිකර්ම හා පශුසම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් හා අනුමැතිය මත ක්‍රියාවට නැංවීම.

(5) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු වගා කළ හැකි බිම් හා පශුසම්පත් උපරිම අන්දමින් පරිභෝජනය කිරීම.

(6) තිරසාර කෘෂිකාර්මික උපායමාර්ගයන් මුදුන්පත් වන අයුරින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ ඉඩම්, මානව සම්පත් සහ යන්ත්‍ර සූත්‍ර කළමනාකරණය කිරීම.

(7) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පශු වෛද්‍ය සේවයට අදාළ සියලු කටයුතු සඳහා වගකිව යුතුය.

(8) යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් පරිදි මෙහෙයුම් කටයුතු සඳහා හවුපිරිස් සැපයීම.

ඊ. **<u>කෘෂිකර්ම හා පශුසම්පත් පුහුණු පාසල</u>**. කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තම රාජකාරි ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායෙහි ව්‍යක්තීය නිලධාරීන්, සෙනීන් සහ අනෙකුත් රෙජිමේන්තුවල තෝරාගත් අයවලුන් හට දැනුම හා කුසලතාවයන් ලබාදීම කෘෂිකර්ම හා පශු සම්පත් පුහුණු පාසලේ කාර්යභාරය වන අතර එහි කාර්යයන් පහත පරිදි වේ.

1. සෙසුනිලයින් සඳහා වෘත්තීය පාඨමාලා පැවැත්වීම.

(අ) කෘෂිකර්ම ප්‍රදර්ශක.
(ආ) කෘෂිකර්ම උපදේශක.
(ඇ) ට්‍රැක්ටර් රථ ක්‍රියාකරු.

2. යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම.

(අ) මූලික කෘෂිකර්ම හා පශුසම්පත් පාඨමාලාව.
(ආ) උසස් කෘෂිකර්ම හා පශුසම්පත් පාඨමාලාව.
(ඇ) විශේෂීකරණ කෘෂිකර්ම හා පශුසම්පත් පාඨමාලාව.
(ඈ) ආධ්‍යාත්මික පෛවගත හෙළ ගොවිකම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.



4. රජය විසින් ක්‍රියාත්මක කරන අත්‍යවශ්‍ය එළවලු වර්ග, කිරි නිෂ්පාදනය සහ ධාන්‍යවර්ග වලින් මෙරට ස්වයංපෝෂිත කිරීම හා ශ්‍රී ලංකාව තුළ හරිත කෘෂි කර්මාන්තයක් බිහිකිරීම මූලික අරමුණ කරගෙන 2020 වර්ෂයේ පිහිටුවන ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය වෙතින් 2022 වර්ෂයේදී පහත ඉලක්කයන් සපුරා ඇති අතර, එම නිෂ්පාදනයන් සාර්ථක ලෙස සහනදායි මිල ගණන් යටතේ සිවිල් සහ යුද්ධ හමුදා සාමාජිකයින් අතර බෙදාහැරීම සඳහා ක්‍රමවේදයක් සකස් කොට ඇත.

අ. විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදුකිරීම.

ආ. අපනයන ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය.

ඇ. දියර කිරි ජීවානුහරණය කිරීම හා දියර කිරි යොදා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වාදීම.

ඈ. බිත්තර අවශ්‍යතාවය ලබාදීම.

ඉ. ශ්‍රී ලංකා ලුණු සංස්ථාව එක්ව නිෂ්පාදනය ආරම්භ කිරීම

ඊ. අක්කර 500 ක ප්‍රමාණයක අඹ වගා ව්‍යාපෘතිය.

උ. අක්කර 1,000 ක පොල් වගා ව්‍යාපෘතිය.

ඌ. පොල් පැල නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය.

එ. අවශ්‍ය කැලෑ සළාක මලු ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නතරකර කැලෑ සළාක මලු නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.

ඒ. රසායනික පොහොර භාවිතය සීමා කිරීම හේතුවෙන් සියළු යුද්ධ හමුදා ගොවිපල කේන්ද්‍ර කරගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය.

5. **<u>නව්‍ය තාක්ෂණික නැඹුරුව</u>**. යුද්ධ හමුදා මූලෝපායික සැලැස්මට අනුව යමින් යුද්ධ හමුදාවේ සිදුකරනු ලබන කාර්යන්හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, නව්‍ය තාක්ෂණික මෙවලම් භාවිතය ඉහළ නැංවීම, යුද්ධ හමුදාව තුළ කඩදාසි භාවිතය අවමකර ඒ සඳහා වන වියදම් කළමනාකරණය කිරීම යන අරමුණු පෙරදැරි කර ගනිමින් යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් අනුව යමින් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් මෘදුකාංග ව්‍යාපෘති 33 ක් හා වෙබ් පිටු 13 ක් මෙම වර්ෂය තුළදී නවතමයෙන් නිර්මාණයකර එළිදක්වන ලදී. ඉන් කිහිපයක් පහත සඳහන් පරිදි වේ.







යුද්ධ හමුදා සාමාජියන්ගේ වැටුප් හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා E – Portal යෙදවුම



ඉන්ධන කළමනාකරණ පද්ධතිය.

සමස්ත ශ්‍රී ලාංකිකයන් විසින් අපේක්ෂිත වගකීම් රැසක් ඉටුකරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2021 වසරෙහි ලද දියුණුව හා අත්දැකීම් පිළිබඳ සමාලෝචනය කරමින් '**2020 - 2025 යුද්ධ හමුදා පස් අවුරුදු මූලෝපායික සැලැස්ම**' කරා යන ගමනේ 2022 වසරෙහි විවිධ ක්ෂේත්‍රයන්හි ලද ප්‍රගමනය තවදුරටත් සහතික කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අපේක්ෂිත අරමුණු ළඟාකර ගනිමින් සිටියි. එමෙන්ම, ජාතික ආරක්ෂාව තහවුරු කරනු වස් ක්‍රියාකරනවා මෙන්ම එයින් ඔබ්බට යමින් තම සමාජ වගකීම ඉටුකිරීම සඳහා විශාල මෙහෙවරක් සිදුකරමින් සිටියි. ඒ අනුව යුද්ධ හමුදාව හා සිවිල් සමාජයේ සංහිඳියාව වර්ධනය කරමින් යුද්ධ හමුදා ආයතනයන් ස්ථානගතව ඇති ප්‍රදේශයන්හි සමාජසේවා කටයුතු සඳහා 2022 වර්ෂය තුළ විශාල දායකත්වයක් ලබාදෙන ලදී.





2.2 ඉදිරි දැක්ම

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් එහි ආරම්භයේ සිටම ආදර්ශමත් හා පරාර්ථකාමී සේවාවක් මඟින් මෙරට පුරවැසියන්ගේ විශ්වසනීයත්වය දිනාගනිමින් ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරන ලදි. ජාතික ආරක්ෂාවෙහි සමාජ සංස්කෘතික පැතිකඩ පිළිබඳ අවධානය යොමුකරමින් සාමය, ආර්ථික ප්‍රගතිය, ජාතිය ගොඩනැගීම, සංවර්ධනය සහ ජනතාවගේ ජීවන රටාව සුරක්ෂිත කර ගැනීම සඳහා අභ්‍යන්තර හා බාහිර තත්ත්වයන් තුළින් ඇති වන සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන තර්ජන වලට එරෙහිව කටයුතු කිරීමට මෙන්ම භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව සුරක්ෂිත කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාව විධිමත් සංවිධානභාවයකින් හා පූර්ණ සූදානම්භාවයකින් යුක්ත විය යුතුය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අනාගතයේදී ප්‍රධාන වශයෙන් කාර්යයන් දෙකක් සිදුකිරීමට බැඳී ඇත. ඉන් පළමුවැන්න වර්තමානයේ එල්ල විය හැකි සාම්ප්‍රදායික තර්ජනවලට එරෙහිව කටයුතු කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය සූදානම් බව තහවුරු කිරීම වේ. දෙවැන්න බෙදුම්වාදී ත්‍රස්තවාදයන්ගේ මතුවීම සහ ප්‍රචණ්ඩ අන්තවාදය ඇතුළුව සිදුවිය හැකි සාම්ප්‍රදායික නොවන තර්ජනවලින් මෙරට සුරක්ෂිත කිරීමය.

2. **සාධක 7 කින් සමන්විත ප්‍රවේශය**. ජාතියේ ප්‍රගතිය උදෙසා සාමකාමී වාතාවරණයක් පවත්වාගෙන යාම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ප්‍රධානතම කාර්යභාරය බවට පත්ව ඇත. ඒ සඳහා වර්තමාන හා අනාගත ආරක්ෂක පරිසරයන්, ප්‍රවණතා, තර්ජන හා අභියෝග පිළිබඳ අවධානය යොමු කරමින් දේශයේ සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ක්‍රියා සැලැස්ම ඇතුළත්ව යුද්ධ හමුදාවේ දැක්ම, හර පද්ධතීන්, අරමුණු හා උපායමාර්ග පිළිබඳ දැක්වෙන '**2020 - 2025 යුද්ධ හමුදා පස් අවුරුදු මූලෝපායික සැලැස්ම**' හඳුන්වා දෙන ලදි. එම සැලැස්ම ඉලක්කගත සාධක 7 කින් සමන්විතව ඇති අතර එය සවිස්තරාත්මකව පහත පරිදි දැක්විය හැක.



සාධක 7 කින් සමන්විත ප්‍රවේශය

අ. **<u>ජාතික ආරක්ෂාව</u>**. නැඟී එන අභියෝග හඳුනා ගැනීම සහ මාතෘ භූමියෙහි ආරක්ෂක අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය ශක්‍යතා හා නිපුණත්වය අනුවර්තනය කර ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමෙහිලා ප්‍රමුඛ දායකත්වය සපයන්නා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අඛණ්ඩව කටයුතු කරනු ඇත.

(1) **<u>මෙහෙයුම් සඳහා වන සූදානම්භාවය</u>**. රාජ්‍යයේ ආරක්ෂක අවශ්‍යතා සපුරාලීම සඳහා සූදානම්භාවය පවත්වාගෙන යාම වෙනුවෙන් යුද්ධ හමුදාව සතු බහුශ්‍රැතභාවය හා සඵලතාව අත්‍යවශ්‍ය වේ. උපායමාර්ගික ස්ථානගතකරණය, ශක්‍යතා වර්ධනය, මෙහෙයුම් ඉලක්කගත පුහුණුව හා අනාගත අභියෝග තක්සේරු කළ හැකි උපාය මාර්ගික අධ්‍යාපනය මඟින් එය ළඟා කර ගත හැක. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විරස්ථායි හර පද්ධතිය පිළිබඳව මනා දැනුවත්භාවය මඟින් සිදුවන සුභවාදී ආකල්පමය පරිවර්තනය පුහුණුවෙහි පදනම වනු ඇත.

(2) **<u>හමුදාව නවීකරණය කිරීම</u>**. මෙහෙයුම් පරිසරය තුළ නැඟී එන සංකීර්ණතාවලට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ධාරිතාවය සහ හැකියාවන් වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය කෙරෙහි අවධානය යොමුකළ යුතුය. ඉහළ සංග්‍රාමික කාර්යක්ෂමතාවයක් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය උපාය මාර්ග වර්ධනය කිරීමේදී යුද්ධ හමුදාව නවීකරණය කිරීම අත්‍යවශ්‍ය අංගයකි. මෙහි අවසන් අරමුණ වන්නේ සාමය, සංවර්ධනය සහ ජාතික ප්‍රගමනය ප්‍රවර්ධනය හා ස්ථාවරභාවය පත් කරන ප්‍රවණ්ඩත්වයෙන් තොර පරිසරයක් සහතික කරන්නෙකු බවට යුද්ධ හමුදාව පත්කිරීමයි.

(3) **<u>සියළුම නිල කළමනාකරණ හා වෘත්තීය ප්‍රගමනය</u>**. ආයතනයෙහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත් සංවිධානය කිරීමට සහ උත්තේජනය කිරීමට සමත් විනිවිදභාවයෙන් යුත් අඛණ්ඩ වෘත්තීය සැලැස්මක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සියලුම නිලයන්ගේ වෘත්තීය සැලසුම්කරණය හා සංවර්ධන ක්‍රියාවලියේදී ආයතනික පුහුණුව, මෙහෙයුම් පැවරුම් සහ ස්වයං වෘත්තීය සංවර්ධනය යන අංගයන්හි මනා සමතුලිතභාවයක් තිබිය යුතුය.

(4) **<u>සාමාජිකයින්ගේ සුභසාධනය</u>**. ආයතනය කෙරෙහි විශ්වාසය, ගරුත්වය, පක්ෂපාතීත්වය මෙන්ම විශ්වාසය ප්‍රවර්ධනය සඳහා සුබවාදී හා දිරිගන්වනසුළු වැඩ පරිසරයක් නිර්මාණය කිරීම, කීර්තිනාමය පවත්වාගෙන යාම සහ යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය ගොඩනැඟීම සඳහා දැනට සේවයේ නියුතු, විශ්‍රාමලත්, තුවාල ලැබුවන්ගේ සහ යුධ භූමියේදී රණකීර්තියට පත්වුවන්ගේ පවුල් වල සාමාජිකයින්ට අවධානය යොමුකරමින් ඔවුන් රැකබලා ගැනීම ඉතා වැදගත් වේ.

(5) **<u>ගෞරවනීය විශ්‍රාමික ජීවිතය</u>**. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විශ්‍රාමික හමුදා සාමාජිකයන්ගේ යහපැවැත්ම හා ගෞරවය සහතික කරනු ලැබේ. යුද්ධ හමුදාවෙහි සමස්ත ප්‍රතිරූපය ගොඩනැංවීමෙහිලා මෙන්ම, යුද්ධ හමුදාවෙහි විශ්වසනීයත්වය, පක්ෂපාතීත්වය, සහයෝගීතාවය හා ගෞරවය ඇති කිරීමෙහිලා මෙය ප්‍රමුඛ කරුණක් බවට පත් වේ. දේශයේ යහපැවැත්ම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයන් විසින් දිවිහිමියෙන් සිදුකරනා ලද කැපකිරීම හඳුනාගැනීම සඳහා ඔවුනට ගෞරවාන්විත විශ්‍රාම දිවියක් සහතික කිරීම ඉතා වැදගත් වේ.

(6) **<u>ජාතිය ගොඩනැගීම සහ සංහිඳියාව</u>**. ඕනෑම අවස්ථාවක පූර්ණ සූදානම්භාවයකින් යුතු විශාලතම සංවිධානයක් වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට තරහකාරී බව හා මනා විනය ආවේණික ගුණාංග වේ. ජාතියේ සංවර්ධනය සහතික කිරීම හා තිරසාර සාමය හා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීම අරමුණ ඇතිව ජාතිය ගොඩනැංවීම, ජාතික උරුම සංරක්ෂණය සහ සංහිඳියාව සඳහා රජය දරන විශාල ප්‍රයත්නයන්ට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අඛණ්ඩව සහාය ලබාදෙනු ලැබේ.

<u>ආයතනයේ ප්‍රගතිය</u>

1. **<u>අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී ඇති ව්‍යාපෘති</u>**



වෙඩිද්‍රව්‍ය ගබඩාව - සූනානි



වෙඩිද්‍රව්‍ය ගබඩාව - ගජසිංහපුර



තෙමහල් මධ්‍යම අවි ගබඩා ගොඩනැඟිල්ල - පනාගොඩ



වෙඩිද්‍රව්‍ය ගබඩාව - අහුණුවැල්පැළැස්ස

2. ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකකය මගින් 2022 වසරේ සැප්තැම්බර් මස 30 වන දින දක්වා ලබා ගන්නා ලද සාර්තකත්වය.

යන්ත්‍ර මඟින් භූමිය සැකසීම (m^2)	හටපිරිස් විසින් විසින් භූමිය මතුපිටින් පරීක්ෂා කිරීම (m^2)	හටපිරිස් විසින් භූමිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව භූමිය අඩු කිරීම (m^2)	හටපිරිස් විසින් නිසැක කිරීම (m^2)	සුනඛයින් මඟින් නිසැක කිරීම (m^2)	එකතුව (m^2)	පුද්ගල නාශක බිම්වෙඩි	පුපුරා නොගිය යුධෝපකරණ
45,705	6,863	78,609	142,827	29,146	**303,150**	245	53

අ. බිම්වෙඩි ඉවත් කිරීමේ ක්‍රියාවලිය සඳහා වන ක්‍රමවේදයන්



හටපිරිස් මඟින්



සුනඛයින් මඟින්



යන්ත්‍ර මඟින්

3. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා නිලධාරීන් 47ක් හා සෙසුනිලයින් 387ක් පහත සඳහන් පරිදි සහභාගීකරවා ඇත.

අනු අංකය	හටපිරිස් ස්ථානගත කර ඇති රාජ්‍ය	හටපිරිස් සංඛ්‍යාව	
		නිලධාරි	සෙසුනිල
1	ලෙබනන්	10	115
2	දකුණු සුඩානය	17	49
3	මාලි රාජ්‍යය	20	223
එකතුව		**47**	**387**

4. රාජය මූල්‍ය කටයුතු විනිවිධභාවයෙන් හා වගවීමෙන් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුකරන ලද සම්පූර්ණ අභ්‍යන්තර විගණන සංඛ්‍යාව 274 ක් වන අතර, කළමනාකරණ විගණන වක්‍රලේඛ අනුව ඉදිරිපත් කළයුතු වාර්තා නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කර ඇත.

5. යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයින් 15,473 ක් සඳහා 2022 වර්ෂයේදී යුහ යහසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දී ඇති අතර, 2022.09.30 දිනට සම්පූර්ණ ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාව 174,088 ක් වේ.

6. ක්‍රියාන්විතයේ දී තුවාල ලබා අත්/පාද අහිමි දැනට පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්/ සුවසහන නිකේතනයන්හි නේවාසික ප්‍රතිකාර ගනු ලබන රණරක්ෂිත රණවිරුවන් හා රාජකාරී නියුතු රණරක්ෂිතයට පත් රණවිරුවන් හට අවශ්‍ය කෘතිම අවයව නිෂ්පාදන කටයුතු සිදු කිරීම සඳහා සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාර 5 ක් ස්ථාපිත කර එමගින් රණවිරුවන්ගේ මෙන්ම සිවිල් අයවලුන්ගේ කෘතිම අත් පාද නිෂ්පාදනය කරදීම සිදුකරනු ලබයි.

7. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD) සමග ඇති සම්බන්ධතාවයෙන් යුද්ධ හමුදාවේ නව නිපැයුම්කරුවන් හට නිර්මාණ කුසලතාවයන් වැඩි දියුණු කර ගැනීම සඳහා පුහුණු වැඩමුලු පවත්වන ලදි. එම නිපුණත්වයෙන් රට තුළ පවතින ආහාර සහ ඛණිජ තෙල් හිඟයට පිළියමක් වශයෙන් දැනට භාවිතාකරන ඛණිජ තෙල් මඟින් ක්‍රියාත්මක කරනු ලබන යන්ත්‍ර වෙනුවට වැඩි කාර්යක්ෂමතාවයකින් යුක්ත තනි පුද්ගලයෙකුට පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි සරල බීජ සිටුවීමේ යන්ත්‍රයක් නිර්මාණය කිරීම.

8. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් ජාතික/ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ රාශියක් හිමිකරගන්නා ලද අතර, එහි ප්‍රථිපලයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්ව ඇත.

අනු අංකය	**තරඟාවලිය**	**ක්‍රීඩා ඉසේව**	**ශූරතාවය**
1	පොදු රාජ්‍ය මණ්ඩලීය මලල ක්‍රීඩා තරඟාවලිය 2022	මීටර් 100 (පිරිමි)	ලෝකඩ
		බර ඉසිලීම (පිරිමි)	ලෝකඩ
2	ජාත්‍යන්තර බර ඉසිලීමේ ශූරතාවලිය 2022.	කි.ග්‍රෑ. 67 බර පන්තිය	රන්
		කි.ග්‍රෑ. 55 බර පන්තිය	ලෝකඩ
3	ආසියාතික අයෝමය පුරුෂයා තේරීමේ තරඟාවලිය 2022		රන්
4	වෙනත් ජාත්‍යන්තර තරඟාවලි		රන් - 4 රිදී - 23 ලෝකඩ -4

<u>ක්‍රියාත්මක කර ඇති සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති</u>

අ. <u>නව නිපැයුම් සංවර්ධන ව්‍යාපෘති</u>



කසල ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර ව්‍යාපෘතිය



එළවළු ප්‍රවාහන රථ ව්‍යාපෘතිය

ආ. <u>ජාතික සංවර්ධන ව්‍යාපෘති</u>



මයිලඩි සිට කඩ්ඩුවාන් දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම



මාතර පරෙවි දූපත වෙත මගී පාලමක් ඉදිකිරීම

ඇ. <u>කෘෂිකාර්මික වැඩසටහන්ව/ව්‍යාපෘති</u>

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පරිභෝජනය සඳහා මෙන්ම විදේශ විනිමය හිඟතාවය හේතුවෙන් ආහාර ආනයනය සීමාවීම හේතුවෙන් ජනතාවට ඇතිවිය හැකි අපහසුතා මඟහරවා ගැනීමේ අරමුණින් දිවයිනේ විවිධ ප්‍රදේශයන් ආවරණය වන පරිදි යුද්ධ හමුදා ගොවිපල 19 ක කෘෂිකාර්මික සහ සත්ව පාලන ව්‍යාපෘති පවත්වාගෙන යනු ලැබේ.



මිරිස් වගා ව්‍යාපෘතිය



අඹ වගා ව්‍යාපෘතිය

4. <u>අනෙකුත් ව්‍යාපෘති</u>

අ. මිත්‍ර ශක්ති ඒකාබද්ධ යුධ අභ්‍යාසය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් නිලධාරින් 18ක් සහ සෙසුනිලයින් 102 ක ප්‍රමාණයක් ඉන්දියාව බලා පිටත්වීමට සැලසුම් කර ඇත.

ආ. විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා 04 ක් මෙම වර්ෂයේදී පැවැත්වීමට අපේක්ෂා කර ඇති අතර, එක් පාඨමාලාවක් සඳහා නිලධාරින් 24 ක් හා සෙසුනිලයින් 192 ක් පුහුණු කිරීමට සැලසුම් කර ඇත.

ඇ. ශ්‍රී ලංකාවෙහි රෝගීන්හට පැමිණීමට අසීරු ප්‍රදේශ ආවරණය කිරීම සඳහා නවතමයෙන් බුස්ස, කුරුණෑගල, රත්නපුර, අම්පාර සහ හම්බන්තොට යන ස්ථානයන්හි ක්ෂේත්‍ර රෝහල් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

ඈ. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව වෙත සාමාන්‍ය ගිලන්රථ 18 ක් සහ විශේෂ ගිලන්රථ 01 ක් 2022 වර්ෂයේදී මිලදී ගැනීමට අපේක්ෂා කර ඇත.

ඉ. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව වෙත විශේෂඥ වෛද්‍යවරුන් 07 ක සංඛ්‍යාවක් 2023 වර්ෂයේදී බඳවා ගැනීම.

ඊ. ශ්‍රී ලංකාව තුළ හටගන්නා ස්වභාවික විපත් සහ අනෙකුත් ජාතික ව්‍යසන අවස්ථාවන් පාලනය කිරීම සඳහා ආපදා කළමනාකරණ කණ්ඩායම් 09ක සංඛ්‍යාවක් නියමිත ස්ථාන තුළ මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි එම ආපදා කළමනාකරණ කණ්ඩායම් ස්ථාපිත කිරීම් අදියර දෙකක් යටතේ ස්ථාපිත කිරීම.

උ. ස්වාභාවික ව්‍යසන සහ කලහකාරී සිදුවීම් අවස්ථාවලදී රජයේ රෝහල් යාන්ත්‍රණය අකර්මන්‍ය වූ විට අත්‍යාවශ්‍ය වෛද්‍ය කණ්ඩායම් යෙදවීම සඳහා නිශ්චිත මෙහෙයුම් ඒකකයක් ස්ථාපිත කර එම කටයුතු ක්‍රියාත්මක කිරීම.

ඌ. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨයේ දන්ත වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීමට සැලසුම්කර ඇත.

එ. අක්කර 320 කින් යුත් බඩ ඉරිගු ව්‍යාපෘතියක් යුද්ධ හමුදා ගොවිපල නිරාවිය, කන්දකාඩු, ආඩියාපුලියන්කුලම්, මැණික්ෆාම්, වෙල්ලම්කුලම්, පාංගොල්ල හා කන්කසන්තුරේ යන ගොවිපලයන්හි එළඹෙන මහ කන්නයේදී ආරම්භ කිරීමට නියමිතව ඇත.

පරිච්ඡේදය 3

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තක්සා 2022 රු.	2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		212,977,042,000	204,005,786,000	ඒසීඒ-3
	පෙර වසරේ අග්‍රිම ශේෂය		131,229,944	220,442,864	
-	තැන්පතු		352,947,882	322,885,627	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		2,400,799,328	2,478,250,949	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**215,862,019,154**	**207,027,365,440**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**215,862,019,154**	**207,027,365,440**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	**996,977,958**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**215,862,019,154**	**206,030,387,482**	

	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
148,147,988,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	147,900,115,057	136,368,926,235	
52,507,264,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	41,376,721,531	36,344,974,195	**ඒසිඒ-2(ii)**
257,695,050	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	242,254,436	267,902,050	
-	පොළී ගෙවීම්	**8**	-	-	
304,950	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	297,573	-	
200,913,252,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**189,519,388,597**	**172,981,802,480**	
	මූලධන වියදම්				
600,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	456,846,730	377,515,460	
3,057,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,966,194,323	3,244,136,784	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
600,000,000	හැකියා වර්ධනය	**14**	504,148,092	1,067,404,507	
616,500,000	වෙනත් මූලධන වියදම්	**15**	244,627,061	1,315,691,948	
4,874,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**4,171,816,206**	**6,004,748,699**	
	තැන්පතු ගෙවීම්		391,411,536	323,497,157	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		1,828,178,347	2,501,317,649	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**2,219,589,883**	**2,824,814,806**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		195,910,794,686	181,811,365,985	
205,787,252,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**19,951,224,468**	**24,219,021,497**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		19,879,766,201	24,087,791,553	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		71,458,267	131,229,944	**ඒසිඒ-3**
			19,951,224,468	**24,219,021,497**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022	2021
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	107,380,117,528	87,525,046,736
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	2,602,229,649	3,182,273,336
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	71,458,267	131,229,944
මුළු වත්කම්		**110,053,805,444**	**90,838,550,016**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,536,450,534	3,070,044,317
දේපළ පිරියත හා උපකරණ සංචිතය		107,380,117,528	87,525,046,736
කුළී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	9,013,750	17,000,000
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	56,765,365	95,229,019
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	71,458,267	131,229,944
මුළු වගකීම්		**110,053,805,444**	**90,838,550,016**

පිටු අංක 10 සිට 37 දක්වා ඒසීඒ I සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇමුණුම් පිටු අංක 38 සිට 70 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කමල් ගුණරත්න ඩබ්ඩබ්වී ආර්ඩබ්ලිවිපි ආර්එස්පි යුඑස්පි එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ජෙනරල් (විශ්‍රාමික)
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
2023 පෙබරවාරි මස 27 දින

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්ලිපි ආර්එස්පි යූඑස්පි එන්ඩීයී පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

.....
ගණන්දීමේ නිලධාරී
ඒඒ එල් වී එම් ලියනගේ ආර්ඩබ්ලිවිපි ආර්එස්පි එන්ඩීයූ
ලුතිනන් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති
2023 පෙබරවාරි මස 23 දින

Lieutenant General
COMMANDER OF THE ARMY

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මූදල්) /කොමිසාරිස් (මූදල්)
යුඑස්එල් කුමාර
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
2023 පෙබරවාරි මස 20 දින

යුඑස්එල් කුමාර
අධ්‍යක්ෂ මුදල්
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

3.3 **මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තක්‍ෂ	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-
ලාභ		-
ආදායම් නොවන ලැබීම්	7,112,048,474	7,285,100,380
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	9,579,098,950	5,434,244,427
අග්‍රිම ලැබීම්	213,108,271,944	204,226,228,864
අත්තිකාරම් අයකර ගැනීම්	2,400,799,328	2,478,250,949
තැන්පතු ලැබීම්	352,947,882	322,885,627
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**232,553,166,578**	**219,746,710,247**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	189,277,134,161	172,713,900,430
සහනාධාර සහ මාරුකිරීම්	242,254,436	267,902,050
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	36,570,913,625	36,807,136,360
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	996,977,958
අත්තිකාරම් ගෙවීම්	1,828,178,347	2,501,317,649
තැන්පතු ගෙවීම්	391,411,536	323,497,157
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**228,309,892,105**	**213,610,731,604**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,243,274,473**	**6,135,978,643**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-
උපණය අයකර ගැනීම්		-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	4,171,816,206	6,004,748,699
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,171,816,206**	**6,004,748,699**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(4,171,816,206)**	**(6,004,748,699)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**71,458,267**	**131,229,944**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**71,458,267**	**131,229,944**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**71,458,267**	**131,229,944**

3.4 **මූල්‍ය ප්‍රකාශ සටහන්**

අ. **වාර්තාකිරීමේ පදනම**

(1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

(2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

(5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) **මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම ‘‘**වාර්තාකරණ පදනම**’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 <u>ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය</u>

ආදායම් ක්ෂේත්‍රය							ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
								මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
(අ)	(ආ)	(ඇ)	(ඈ)	(ඉ)	(ඊ)	(උ)	(ඌ)	(එ)	(ඒ)	(ඔ)	(ඕ)
2002	0	1	0	1	0	0				47,503,789.24	
2002	0	1	0	99	0	0				2,161,210.50	
2002	0	2	0	99	0	0				135,088,971.13	
2003	0	1	0	0	0	0				626,676.14	
2003	0	3	0	2	0	0				10,550,109.73	
2003	0	99	0	0	0	0				1,104,496,379.10	
2004	0	1	0	0	0	0				5,577,792,468.95	
2006	0	2	0	1	0	0				141,893,755.87	
2006	0	2	0	2	0	0				120,454,923.10	
2002	0	1	0	1	0	0				(14,890.59)	
2002	0	2	0	99	0	0				(53,298.20)	
2003	0	99	0	0	0	0				(17,229,629.55)	
2004	0	1	0	0	0	0				(34,191.81)	
2006	0	2	0	1	0	0				(11,187,800.00)	
එකතුව										7,112,048,473.61	

3.6 **වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය**

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදන		සත්‍ය වියදම (රු.)	ප්‍රතිපාදන භාවිතය අවසන් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	මූලික (රු.)	අවසන් (රු.)		
පුනරාවර්තන	180,740,190,000	200,913,252,000	189,455,194,012	94.30%
ප්‍රාග්ධන	5,509,280,000	4,874,000,000	4,171,816,208	85.59%

3.7 **2022 වර්ෂයේදී වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් වෙනුවෙන් යුද්ධ හමුදාව වෙත ලබාදුන් ප්‍රතිපාදන හා ඊට අදාළ වියදම් විස්තර (2022-12-31 දිනට)**

අනු අංකය	ප්‍රතිපාදන වෙන්කර දුන් දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය	ව්‍යාපෘති/වැඩ සටහන නම	ප්‍රතිපාදන ප්‍රමාණය		මුළු වියදම (රු.)	ප්‍රතිපාදන උපයෝජනය
			මූලික ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)		
1	ජනාධිපති ලේකම් කාර්යාලය	ජනාධිපති කාර්යාල රාජකාරි හැදුනුම්පත් සකස් කිරීම සඳහා වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා	266,011.17	461,580.29	400,393.00	87%
		දික්වැල්ල - බතිගම රෝහල කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේ බැඳීම් හා බැරකම් නිරවුල් කිරීම සඳහා	396,027.47	396,027.47	70,248.60	18%
2	ආරක්ෂක අමාත්‍යාංශය	ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ වාහන නඩත්තු කිරීම සඳහා	525,000.00	718,133.50	718,133.40	100%
		උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියේ ලග්ගල සන්නිවේදන කුළුණේ ප්‍රවේශ මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා (දෙවන අදියර)	20,489,877.45	2,182,330.00	2,181,730.00	100%
		යුද්ධ හමුදා පතොරොම් ගබඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සඳහා (පූනානි)	62,380,000.00	192,380,000.00	154,811,386.94	80%
		ජාතික ශිෂ්‍යභට බලකායේ රංටැබේ පුහුණු මධ්‍යස්ථානය සඳහා නවාතැන් පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා	635,549.56	1,761,475.60	1,087,939.91	62%
		සංඥා උපකරණ නිෂ්කාශණය කිරීම වෙනුවෙන් රේගුව හා ආශ්‍රිත ආයතනික සේවා ගාස්තු සඳහා	1,221,249.00	1,676,321.80	1,676,346.80	100%
3	ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	අකුරම්බඩ ම.ම.වි ක්‍රීඩා පාසල් සංවර්ධන වැඩසටහන	50,000.00	50,000.00	150,000.00	100%
		පොරමඩුල්ල ම.ම.වි ක්‍රීඩා පාසල් සංවර්ධන වැඩසටහන	50,000.00	50,000.00		
		හංවැල්ල රාජසිංහ ම.ම.වි ක්‍රීඩා පාසල් සංවර්ධන වැඩසටහන	25,000.00	25,000.00		
		හේනේගම ම.ම.වි ක්‍රීඩා පාසල් සංවර්ධන වැඩසටහන	25,000.00	25,000.00		
4	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	බිම්වෙඩි ඉවත් කිරීමේ රාජකාරීන් සඳහා	4,300,000.00	4,875,000.00	4,873,291.00	100%

අනු අංකය	ප්‍රතිපාදන වෙන්කර දුන් දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය	ව්‍යාපෘති/වැඩ සටහන නම	ප්‍රතිපාදන ප්‍රමාණය		මුළු වියදම (රු.)	ප්‍රතිපාදන උපයෝජනය
			මූලික ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)		
5	බන්ධනාගාර මූලස්ථානය	වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා රැඳවියන් රඳවා සිටින ස්ථානයේ ආරක්ෂිත වැට මාළු දැල් මගින් ආවරණය කිරීමේ කාර්යට අදාළ බැරකම් හා බැඳීම් නිරවුල් කිරීම සඳහා	37,422.00	37,422.00	37,422.00	100%
		වාරියපොල බන්ධනාගාරයේ ගොඩනැගිලි 4ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව දැරීමට සිදුවූ අමතර පිරිවැය පියවාගැනීම වෙනුවෙන් වූ බැරකම් හා බැඳීම් නිරවුල් කරගැනීම සඳහා	1,822,897.00	1,822,897.00	1,058,974.26	49%
		බන්ධනාගාර මූලස්ථාන පරිශ්‍රයේ අර්ධ ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමේ සේවාවන් වෙනුවෙන් 2021 වර්ෂට අදාළ බිල්පත් පියවීම සඳහා	341,562.70	341,562.70		100%
6	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	කුරගල පුරාණ රජ මහ විහාරයේ භික්ෂු නේවාසිකාගාරය ඉදිකිරීම - (පළමු අදියර)	10,000,000.00	10,000,000.00	7,860,314.98	43%
		වාවකච්චේරි, නාවත්කුලිය, සම්ද්ධි සුමන විහාරයේ සංඝාවාසයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා - (අදියර 1)	1,470,000.00	1,470,000.00		100%
		වාවකච්චේරි, නාවත්කුලිය, සම්ද්ධි සුමන විහාරයේ සංඝාවාසයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා - (අදියර 2)	852,245.00	852,245.00		
		නාවත්කුලිය සම්ද්ධි සුමන විහාරස්ථානයේ සමරුඵලකය ඉදිකිරීම සඳහා	75,000.00	75,000.00		
		නාවත්කුලිය, සම්ද්ධි සුමන විහාරයේ සංඝාවාසය ඉදිකිරීම වෙනුවෙන් 2021 සහ 2022 වර්ෂයවල නොගෙවූ අතැති බිල්පත් පියවීම සඳහා	1,287,647.38	1,287,647.38		
		කනගරායංකුලම් ශ්‍රී සම්බුද්ධරාජ විහාරස්ථානයේ 2021 වසරේ අතැති බිල්පත් නිරවුල්කිරීම සඳහා	133,422.20	133,422.20		
		කනගරායංකුලම් ශ්‍රී සම්බුද්ධරාජ විහාරස්ථානයේ සංඝාවාසයේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා	2,567,821.16	2,567,821.16		

අනු අංකය	ප්‍රතිපාදන වෙන්කර දුන් දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය	ව්‍යාපෘති/වැඩ සටහන නම	ප්‍රතිපාදන ප්‍රමාණය		මුළු වියදම (රු.)	ප්‍රතිපාදන උපයෝජනය
			මූලික ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)		
		කනගරායංකුලම් ශ්‍රී සම්බුද්ධරාජ විහාරස්ථානයේ සංඝාවාසයේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා සිමෙන්ති මලු 50ක් මිලදි ගැනීමට	145,000.00	145,000.00		
		මන්නාරම්, සීලාවතුර, ශ්‍රී විජයතිලක විහාරස්ථානයේ සංඝාවාසයේ ඉතිරිවැඩ නිමකිරීම සඳහා	1,949,800.00	1,949,800.00		
7	කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	2021 වර්ෂයේ ද්‍රවශීල මුදල් නොමැතිවීම හේතුවෙන් ගණකාධිකාරි කාර්යාල තුළ නිරවුල් නොවී පවතින බැරකම් වටිනාකම	4,901,171.22	4,901,171.22	4,901,171.22	100%
8	අධ්‍යාපන අමාත්‍යාංශය	මහියංගනය ජාතික පාසලේ ශ්‍රවණාගාරය ඉදිකිරීමේ සේවාවට අදාළ බැඳීම් වටිනාකම	22,478,072.00	22,478,072.00	19,624,422.23	87%
		තංගල්ල බාලිකා විද්‍යාලයේ සම්පූර්ණ නොවූ ගොඩනැගිලි අලුත්වැඩියාව	23,130,025.71	23,130,025.71		100%
		මීමුරේ කයිකාවල ප්‍රාථමික විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිලි ඉදිකිරීමේ සේවාවට අදාල බැඳීම් වටිනාකම	7,900,000.00	7,900,000.00	7,275,292.36	92%
9	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	රියදුරු බලපත් මුද්‍රණ කටයුතු සඳහා	900,000,000.00	850,000,000.00	320,229,900.90	38%
10	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය	ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සඳහා 2022 වර්ෂයේ තෙවන කාර්තුව වෙනුවෙන් ඉන්ධන ලබාගැනීම	354,362.70	5,000,584.11	4,646,221.41	93%
මුළු එකතුව			**1,069,810,163.72**	**1,138,693,539.14**	**531,603,189.01**	**47%**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	36,406,346,131.64	36,406,346,131.64	-	100%
9152	යන්ත්‍රෝපකරණ	28,350,135,114.36	28,350,135,114.36	-	100%
9153	ඉඩම්	33,705,001,960.00	33,705,001,960.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	35,644,020.77	35,644,020.77	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	60,458,670.00	60,458,670.00	-	100%
9160	කෙරීගෙන යන වැඩ	8,822,375,231.69	8,822,375,231.69	-	100%
9180	බදුදෙන ලද වත්කම්	156,400.00	156,400.00	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2022 වර්ෂයට අදාළ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙයට ඇමුණුම වශයෙන් ඉදිරිපත් කර ඇත.

පරිච්ඡේදය 4

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වැය ශීර්ෂය	විස්තරය	විශේෂ නිර්නායක	සත්‍ය ප්‍රගතිය පුරෝකථනය කරන ලද ප්‍රතිඵලයේ ප්‍රතිශතයක් ලෙස		
			100% - 90%	75% - 89%	50% - 74%
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම					
222-01-1-2001	ගොඩනැගිලි හා ඉදිකිරීම්	අළුත්වැඩියා කළ ගොඩනැගිලි ප්‍රමාණය			✔
222-01-3-2001	ගොඩනැගිලි හා ඉදිකිරීම්	අළුත්වැඩියා කළ ගොඩනැගිලි ප්‍රමාණය		✔	
222-01-3-2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව		✔	
222-01-3-2003	වාහන	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව			✔
මූලධන වත්කම් අත්පත් කරගැනීම					
222-01-3-2102	ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව	✔		
222-01-3-2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව	✔		
222-01-1-2104	ගොඩනැගිලි හා ඉදිකිරීම්	ඉදිකර ඇති ගොඩනැගිලි ප්‍රමාණය	✔		
222-01-3-2104	ගොඩනැගිලි හා ඉදිකිරීම්	ඉදිකර ඇති ගොඩනැගිලි ප්‍රමාණය	✔		
විශේෂ සංවර්ධන ව්‍යාපෘති					
222-01-1-5-2104	යුද්ධ හමුදා රෝහල (පියවර 3)	වැඩ අවසන් කිරීමේ ප්‍රතිශතය	✔		
222-01-1-13-2104	මහල් තුනකින් සමන්විත මධ්‍යම අවි ගබඩා ගොඩනැගිල්ල	වැඩ අවසන් කිරීමේ ප්‍රතිශතය	✔		
පුහුණු කිරීම් හා හැකියා වර්ධනය					
222-01-1-2401	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	පුහුණු සෙබළ සංඛ්‍යාව		✔	
අනෙකුත් මූලධන වියදම්					
222-01-1-1-2509	ආදායම් උපදවනු ලබන වාණිජ ව්‍යාපෘති	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✔		
222-01-1-3-2509	එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව			✔
ණය යෝජනා ක්‍රම					
222-01-3-3-2509-12	පාකිස්තානු ණය යෝජනා ක්‍රමය	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව	2022 වර්ෂයේ වැය දැරීම් සිදු වී නොමැත		
222-01-3-5-2509-12	ප්‍රතිත්‍රස්ථවාද වැලැක්වීම සහ ආරක්ෂාකරණය (GOSL - India)	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-3-5-2509-17	ප්‍රතිත්‍රස්ථවාද වැලැක්වීම සහ ආරක්ෂාකරණය (GOSL - India)	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව			
විශේෂ අයවැය යෝජනා ව්‍යාපෘති					
222-01-3-06-2101	වාහන	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව	✔		
222-01-3-06-2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සංඛ්‍යාව	✔		
(අ) දිවයිනේ විවිධ ප්‍රදේශවල යුද්ධ හමුදාවට අයිති බිම් කැබලි 15 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට දිවයිනේ විවිධ ප්‍රදේශවල දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 330 කට අයත් එකතුව අක්කර 10,240 ක් පවරාගෙන ගිණුම්ගත කිරීම් හෝ මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් අනාවරණය කිරීම් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පාකිස්ථානු රජයෙන් පරිත්‍යාග ලෙස රු.මිලියන 3 ක් වටිනා අශ්වයින් දෙදෙනෙකු ලැබී තිබුණු අතර, මෙම අශ්වයින් දෙදෙනා යුද්ධ හමුදාව විසින් ඉන්වෙන්ට්‍රි ගත කර ගිණුම්වලට ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙම අශ්වයින් දෙදෙනා මියගොස් තිබුණි. මෙම මියයාම නිසා යුද්ධ හමුදාවට වූ හානිය, අලාභ හානි ලෙස වාර්තා කර නොතිබුණු අතර, අශ්වයින් පරිත්‍යාග ලෙස ලැබීමේදී හා මියයාමේදී ඒ සම්බන්ධයෙන් ගිණුම්වලට ගැලපීම්කර නොතිබුණු බැවින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙන් (ඒසීඒ- 6) අත්හැරී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී යුද්ධ හමුදාවට අයත් සුනඛයකු ද මියගොස් තිබුණු අතර, එම තත්ත්වයද අලාභ හානි ලෙස හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉවත් කළ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හෝ හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස රු.බිලියන 9.42 ක් සහ නිවාස නොවන ගොඩනැගිලි ලෙස රු.බිලියන 26.99 ක ශේෂයක් ලෙස එකතුව රු.බිලියන 36.41 ක් දක්වා තිබුණු අතර, යුද්ධ හමුදාව විසින් විගණනයට ඉදිරිපත් කර ඇති නොරතුරු අනුව එකතුව වර්ග අඩි 28,397,152 කට අදාළව ගොඩනැගිලි 14,467 ක මුළු වටිනාකම රු.බිලියන 117.07 ක් ලෙස වාර්තා කර තිබුණි. ඒ අනුව රු.බිලියන 80.67 කට අයත් ගොඩනැගිලි වටිනාකම

මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි. තවද, යුද්ධ හමුදාව පවත්වාගෙන ගිය ස්ථාවර වත්කම් ලේඛන අනුව ගොඩනැගිලි 12,304 ක වටිනාකම රු.බිලියන 81.98 ක් වූයෙන් රු.බිලියන 35.09 ක් වටිනා ගොඩනැගිලි 2,163 ක ප්‍රමාණයක් ලේඛන ගත වී නොතිබුණි.

1.6.1.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂවල සිට අවිචිඡින්නව පැවති ඉදිකිරීම්/ නවීකරණ වලින් කොටසක් ඇතුලුව සමාලෝචිත වර්ෂයේ වැඩ නිමකරන ලද ඉදිකිරීම්/ නවීකරණය කිරීම් වටිනාකම රු.මිලියන 467.3 ක් වූ අතර, වර්ෂය අවසානයේ මෙම වටිනාකම් ප්‍රාග්ධනිත නොකර නොනිමි වැඩ ලෙසම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසිඒ-06) දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ යුද්ධ හමුදාවට අයත් වාහන, ධාවන පැදි, ට්‍රැක්ටර් ට්ලර් (අමතර කොටස් සමඟ) 334 ක්, කාර්යාල ගෘහ භාණ්ඩ හා විදුලි උපකරණ 91 ක් සහ බර යන්ත්‍ර උපකරණ 26 ක් අපහරණය කර රු.මිලියන 289.91 කට අලෙවිකර තිබුණි. මෙම වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ(ඒසිඒ-6) ඉවත්කිරීම් යටතේ දක්වා නොතිබුණු අතර, ඒ අනුව වර්ෂ අවසාන ශේෂයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **වියදම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.1.1 **ඇස්තමේන්තු පිළියෙල කිරීම**

මූ.රෙ.50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක්දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත්, පහත සඳහන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු පැවතුණි.

(අ) **සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂය අංක 222-01-03-005-2509-12 යටතේ හා 222-01-03-005-2509-17 දරන වැය විෂය යටතේ ආරක්ෂාව හා ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා වන ව්‍යාපෘති (ශ්‍රී ලංකා-ඉන්දියා) දෙක සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 205 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

(ආ) **ප්‍රතිපාදන ඌණ උපයෝජනය**

පුනරාවර්තන වැය විෂයන් 22 ක් සඳහා එකතුව රු.බිලියන 40.87 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන්, එකතුව රු.බිලියන 11.22 ක ප්‍රතිපාදනද, මූලධන වැය විෂයන් 8 ක් සඳහා එකතුව රු.බිලියන 1.76 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන්, එකතුව රු.මිලියන 419.94 ක ප්‍රතිපාදනද උපයෝජනය නොකර ඉතිරි කර තිබුණු අතර, එම ඉතිරි කිරීම් ප්‍රමාණය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට හයේ සිට සියයට අසූඅට දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) **වෙන්කරගෙන තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ අතිරික්ත වීම**

පුනරාවර්තන වැය විෂයන් පහකට සහ මූලධන වැය විෂයන් තුනකට සළසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ. 66 මඟින් පිළිවෙලින් රු.බිලියන 4.61 ක් සහ රු.මිලියන 145.5 ක් වෙනත් වැය විෂයන්වලින් මාරුකරගෙන තිබුණු අතර, මෙසේ ප්‍රතිපාදන මාරුකර නොගත්තේ නම් ඉහත (ආ) ඡේදයේ පරිදි සළසාගෙන තිබුණු ප්‍රතිපාදනවලින් ඉතිරිවීමේ ප්‍රමාණය හා ප්‍රතිශතය තවදුරටත් ඉහළ යන බවද නිරීක්ෂණය කෙරේ. තවද, පුනරාවර්තන වැය විෂයන් දෙකකට රු.බිලියන 9.64 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ද සළසාගෙන තිබුණි.

(ඈ) **ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳීම**

වැය විෂයන් විසි හතක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූයෙන් එය ඉක්මවා වර්ෂය අවසානයට රු.බිලියන 9.81 ක බැරකම් සඳහා බැඳීමට සිදු වී තිබුණි.

2.1.2 **පරිපූරක ඇස්තමේන්තු මඟින් ලබාදුන් ප්‍රතිපාදන ඉතිරි කිරීම**

අංක 222-01-02-1203 වැය විෂයට (ආහාර හා නිල ඇඳුම්) ලබාදුන් එකතුව රු.බිලියන 9 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් වර්ෂය අවසානයට සියයට 99 ක් හෙවත් රු.බිලියන 8.91 ක් ඉතිරි කර තිබුණි.

2.1.3 **මු.රෙ 66 මඟින් මාරුකරගත් ප්‍රතිපාදන ඉතිරි කිරීම**

අංක 222-01-03-2102 දරන (ගෘහ භාණ්ඩ හා කර්යාල උපකරණ) වැය විෂයයට සහ අංක 222-01-03-2103 දරන (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම්) වැය විෂයට වෙනත් වැය විෂයන්ගෙන් මු.රෙ 66 යටතේ මාරුකරගෙන තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 7.73 ක් හා රු.මිලියන 30.1 ක් හෙවත් පිළිවෙලින් සියයට 45 හා සියයට 30 ක් ලෙස එසේ මාරුකරගත් ප්‍රතිපාදන වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි.

2.2 රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවය අතහැරගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

යම් නිලධාරියෙකුගේ සේවය අවසන්වනු ඇතැයි අපේක්ෂා කරන දිනට ප්‍රථමයෙන් ඔහුගේ සේවය අවසන් වුවහොත් එවැනි නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.3 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතු වුවත්, වර්ෂය ඉක්ම වූ වර්ෂ 31 දක්වා කාල පරාසයක් තුළ සේවය හැරගොස් ඇති යුධ හමුදා නිලධාරීන් 3314 දෙනෙකුගේ සහ සිවිල් නිලධාරීන් 444 දෙනෙකුගෙන් අයවිය යුතු ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් මුළු ණය ශේෂවල එකතුව රු.මිලියන 43.23 ක් වූ අතර, ණය ශේෂයන් වලින් වර්ෂ පහ ඉක්ම වූ ණය ශේෂය රු.මිලියන 25.58 ක්ද, වර්ෂ 10 ඉක්ම වූ ණය ශේෂවල එකතුව රු. මිලියන 13.95 ක් ද වූ අතර, මෙම ණය ශේෂ අයකරගැනීම් මන්දගාමී ස්වභාවයක පැවතුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ

විශ්‍රාම ගිය හමුදා නිලධාරීන් 182 දෙනෙකුගෙන් සහ සිවිල් නිලධාරීන් 68 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂය ඉක්ම වූ ණය ශේෂ පිළිවෙලින් රු. මිලියන 11.91 ක් සහ රු. මිලියන 2.87 ක් වූ අතර, මෙම ණය ශේෂවලින් වර්ෂ 5 ඉක්ම වූ ණය ශේෂවල එකතුව රු.මිලියන 3.04 ක් විය. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2 ඡේදය ප්‍රකාරව මෙම ණය ශේෂ අයකර ගත යුතු වුවත්, මෙම නිහඬීවී ණය ශේෂ අයකර ගැනීමද දුර්වල මට්ටමක පැවතුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාසය ඉක්ම වූ බැරකම්

මුදල් රෙගුලාසි 94(1) හා 214 ප්‍රකාරව පනවා ඇති නියමයන් අනුව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන නිබුණු බැරකම් වටිනාකම රු.බිලියන 21.1 වූ අතර, එම වටිනාකම තුළ මසකට වැඩි බැරකම් වටිනාකම රු.බිලියන 12 ක් විය.

(ආ) බැරකම් ශේෂ සනාථනයන්

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ණයහිමියන්ගෙන් 67ක නියැදියකින් ශේෂ සනාථනයන් කැඳවූ අතර, ණයහිමියන් 30 දෙනෙකුට ගෙවිය යුතු එකතුව රු.බිලියන 5.36 ක බැරකම්, ණයහිමියන් සනාථ කර නොනිබුණි. තවද තිදෙනෙකු පමණක් ශේෂයන් සමඟ එකඟවී නිබුණු අතර,

ණයහිමියන් 16 දෙනෙකු මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ බැරකම් ප්‍රමාණයට වඩා එකතුව රු.බිලියන 2.22 ක් අඩුවෙන්ද, ණයහිමියන් 18 දෙනෙකු, එකතුව රු.බිලියන 1.57 ක් වැඩියෙන්ද ශේෂ සනාථනයන් ලබා දී තිබුණු අතර, එම ණයහිමියන්ට ගෙවිය යුතු ශේෂයන් මතභේදාත්මක විය.

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.4.1 ප්‍රතිපාදන ඉතිරි කිරීම

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හතක් විසින් විවිධ ව්‍යාපෘති/වැඩසටහන් 15 ක් සඳහා ලබාදී තිබුණු එකතුව රු.මිලියන 1152.83 ක මුළු මූලධන ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 634.16 ක ප්‍රමාණයක් ඉතිරි කර තිබුණු අතර, එම ඉතිරි කිරීම් ප්‍රමාණය සියයට 8 සිට සියයට 90 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. එකතුව රු.මිලියන 58.63 ඇස්තමේන්තු වියදමකින් වර්ෂ අවසානයට වැඩ නිමකළ යුතු ලග්ගල හා ගජසිංහපුර ප්‍රවේශ මාර්ග සහ මීමුරේ ප්‍රාථමික විද්‍යාල ගොඩනැගිල්ලක වැඩ නිමකිරීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 5, 15 සහ 20 තරම් අවම මට්ටමක පැවතුණි. තවද, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර නඩත්තු වියදම් දැරීම සඳහා රු.මිලියන 10.64 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර වර්ෂ අවසානයට ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

2.4.2 ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ එල්ලංගා වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ප්‍රගතිය

2018 වර්ෂයේදී ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය කුඩා පරිමාණයේ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණි. අදාළ ව්‍යාපෘතිය නවීකරණ කටයුතු යුද්ධ හමුදාවට පවරා තිබුණු අතර, මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට රු.මිලියන 100 ක ප්‍රතිපාදනයක් යුද්ධ හමුදාවට චෙන්කර දී තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 කට අදාළ වැව් 11 ක් රු.මිලියන 113 ක වියදමින් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණු අතර, අදාළ වැය ඇස්තමේන්තු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණි. අදාළ ඇස්තමේන්තුවලට අනුව මෙම වැව්වල වැවබැම්ම ප්‍රතිසංස්කරණය, නාන තොටුපළ ඉදිකිරීම, රළපනාව ප්‍රතිසංස්කරණය, ප්‍රවේශ මාර්ග සකස් කිරීම, රොන්මඩ ඉවත් කිරීම, වාන් ඇළ ඉදිකිරීම, ප්‍රධාන කෘෂි මාර්ග නවීකරණය කිරීම, සොරොව් ඉදිකිරීම හා නාම පුවරු සකස් කිරීම වැනි ප්‍රතිසංස්කරණයන්ට අදාළව මෙම ඇස්තමේන්තු සකස් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2023 මැයි 25 දින වන විටත් දුනුමඩලාව, නැබඩගස්දිගිලිය, ගලහිටියාව, හැළඹ යන වැව් හතරෙහි නවීකරණ කටයුතුවල නිම කිරීමේ ප්‍රතිශතය සියයට 70 සිට 90 දක්වා වූ අතර, මෙම වැව්වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු ඉටු නොකර ප්‍රතිසංස්කරණයන් සඳහා වැව් අසලට ගෙනවිත් දමා ඇති කළු ගල්, වැලි ඇතුලු ඉදිකිරීමේ ද්‍රව්‍ය එම ස්ථානවලම ගොඩගසා තිබීම නිසා වී ඇතුලු වගාවන් සඳහා අවශ්‍ය ජලය ලබාගැනීමේ බාධාවන්, මිරිදිය ධීවර කර්මාන්තයට හා විවිධ ජල අවශ්‍යතා සපුරා ගැනීමට ජනතාවට විවිධ දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවී තිබුණි.

(ආ) කෙසේ වෙතත් වැව් ප්‍රතිසංස්කරණය සඳහා සෘජුවම අදාළ නොවන පහත සඳහන් වියදම් සඳහා රු.මිලියන 28.01 ක් වැයකර තිබුණි.

i. යුද්ධ හමුදාවේ ඉල්ලීම පරිදි ජනාධිපති කාර්යාලයේ අනුමැතිය මත රු.මිලියන 26.67 ක වියදමින් ට්‍රැක්ටර් 10 ක් (ට්‍රෙලර්ද ඇතුළුව) හා යතුරුපැදි 05 ක් මිලදීගෙන තිබුණු අතර, ව්‍යාපෘති උපකාර්යාලය පිහිටුවීමට අනුමැතිය ලබා දී තිබුණු රු.මිලියන 4.2 ක මුදලින් රු.මිලියන 1.34 වැයකර ඩෙක්ස්ටොප් පරිගණක 05 ක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, LED රූපවාහිනී යන්ත්‍ර 05 ක්, තණකොළ කපන යන්ත්‍ර 03 ක් හා Chainsaw යන්ත්‍ර 03 ක් මිලට ගෙන තිබුණු අතර, මෙම කාර්යාල හා යන්ත්‍ර උපකරණ අදාළ ව්‍යාපෘතියට සෘජුවම දායක කර ගත්තේද යන්න අනාවරණය කරගත නොහැකි විය.

ii. තවද, වැව් ඉදිකිරීමේ ඇස්තමේන්තුවල සඳහන් නොවුණු සමාරම්භක උත්සව සඳහා රු.මිලියන 1.84 ක් ජනාධිපති කාර්යාලයේ අනුමැතිය මත වැයකර තිබුණු අතර, අදාළ වැව් ප්‍රතිසංස්කරණයන් සඳහා අවශ්‍ය බව දක්වමින් යුද්ධ හමුදාවේ බර වාහන හා බර යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවන් සඳහා රු.මිලියන 3.8 ක්ද වැයකර තිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන යුද්ධ හමුදාව වෙත ලබා දී තිබුණු රු.235,440 ක් වටිනා සිමෙන්ති මිටි 218 ක් යුද්ධ හමුදා කඳවුරුවල විවිධ ඉදිකිරීම් සඳහා භාවිතා කර තිබුණි.

(ඈ) රළපනාව ඉදිකිරීම සඳහා යොදාගන්නා ලද කළුගල් ප්‍රමාණය නබඩගස්දිගිලිය වැව හා හැලඹ වැව සඳහා පිළිවෙලින් කියුබ් මීටර් 400 ක් සඳහා රු.මිලියන 1.54 ක් සහ කියුබ් මීටර් 270 ක් සඳහා රු.මිලියන 1.15 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණු අතර, මෙම ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය කළුගල් සපයාගත් යුද්ධ හමුදාවෙන් ප්‍රසම්පාදනය කරගෙන කියුබ් 50 කට වැඩි ප්‍රමාණයක් නබඩගස්දිගිලිය වැව් පරිශ්‍රයේ බැහැර කොට තිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 104 (3), (4)	සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාවේ වාහන 24 කට සිදුවූ රිය අනතුරුවලින් එකතුව රු.මිලියන 18.57 ක අලාභ හානි සම්බන්ධයෙන් මු.රෙ 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට මාස 02 සිට වසරකුත් මාස 07 කට අධික කාලයක් ප්‍රමාද වී තිබුණු අතර, වාහන 17 කට සිදු වූ එකතුව රු. මිලියන 11.78 ක අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට මාස 03 සිට වසරකුත් මාස 11 ක් දක්වා ප්‍රමාද වී තිබුණි. තවද, 2021 වර්ෂයේදී වාහන 05 කට අදාළව සිදු වූ රිය අනතුරු එකතුව රු. මිලියන 5.86 ක අලාභ හානි සම්බන්ධයෙන් හා 2022 වර්ෂයේ සිදු වූ වාහන 02 කට අදාළව එකතුව රු.937,819 ක අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා 2023 අප්‍රේල් 30 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණු අතර, 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා යුද්ධ හමුදාවේ සලාක හා ඉන්ධන අක්‍රමිකතාවයන් 13 කට අදාළව සිදු වූ එකතුව රු. මිලියන 40.58 ක අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට මාස 05 සිට වසර 02 කුත් මාස 06 ක් දක්වා ප්‍රමාද කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයයන් 06 ක වර්ෂ අවසානයේදී සියයට සියයක ඉලක්කගත ප්‍රගතියක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු අතර, කාර්ය සාධන වාර්තාව අනුව වර්ෂ අවසානයේදී සියයට 50 ත් 74 ත් අතර සහ සියයට 75 ත් 89 ත් අතර කාර්ය සාධනයක් පමණක් ලභාකර ගතහැකි වූ වැය විෂයයන්/ වැඩසටහන්/ ව්‍යාපෘති 03 බැගින් පැවතුණි.

3.2 ප්‍රසම්පාදනයන්

3.2.1 ප්‍රසම්පාදන සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 4.2.1 (අ) සහ (ආ) මාර්ගෝපදේශයන් පරිදි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) යථෝක්ත මාර්ගෝපදේශයේ 4.2.1 (ඇ) මාර්ගෝපදේශය පරිදි ඊළඟට එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2022 වර්ෂය සඳහා රු.බිලියන 47.45 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කරගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි.

3.2.2 සමාලෝචිත වර්ෂයේ සිදු කළ ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාව විසින් සීමිත/පාලිත ජාතික තරහකාරී, ජාතික තරහකාරී හා මිල සැඳැහුම් යන ප්‍රසම්පාදන ක්‍රමයන් අනුගමනය කරමින් සිදු කර තිබුණු රු.මිලියන 890.72 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් කරන ලද විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.2.2.1 සීමිත/ පාලිත ජාතික ලංසු ක්‍රමය යටතේ සිදුකළ ප්‍රසම්පාදනයන්

සීමිත/පාලිත ජාතික තරහකාරී ලංසු ක්‍රමය යටතේ විගණන නියැදි පරීක්ෂාවක් ලෙස රු.මිලියන 700.67 කට අදාළ ප්‍රසම්පාදනයන් පරීක්ෂා කළ අතර, මෙම තරහකාරී ලංසු ක්‍රමය යොදාගත හැකි වන්නේ දන්නා මූලාශ්‍රයන් කිහිපයක් පමණක් පවත්නා විට හා සැපයුම්කරුවන් හෝ නිෂ්පාදකයින් සීමිත සංඛ්‍යාවක් පමණක් සිටින, දැන්වීම් පළකිරීම නාස්තියක් වේ යැයි අදහස් කරන අවස්ථාවල හා මහා පරිමාණයේ ස්වභාවික ව්‍යවසනයකට අදාළ හදිසි ක්‍රියාමාර්ග ගැනීම වැනි තත්ත්වයන් තුළ වුවත්, යුද්ධ හමුදාව විසින් එවැනි තත්ත්වයන් නොතිබුණු මෙම මිලදී ගැනීම්, යථෝක්ත ප්‍රසම්පාදන ක්‍රමය යටතේ සිදු කර තිබුණි. එක් එක් ප්‍රසම්පාදනයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන් 7 ත් 245 ත් වැනි විශාල ප්‍රමාණයකගෙන් මිල ගණන් විමසීම් කර ඇති අතර, ඒ අනුව සැපයුම්කරුවන් සීමිත සංඛ්‍යාවක් නොව විශාල ප්‍රමාණයක් සිටින බව නිරීක්ෂණය වන අතර, මිල ගණන් ඉල්ලුම් කළ දිනයේ සිට භාණ්ඩ ගබඩාවට ලැබීමට මාස 02 සිට වසර තුනකට අධික කාලයක් දක්වා ගතවී තිබුණු බැවින්, මෙම ප්‍රසම්පාදන කටයුතු හදිසි ප්‍රසම්පාදනයන් නොවන බවද නිරීක්ෂණය විය. ඒ අනුව මෙම ප්‍රසම්පාදන ක්‍රමය වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමයේදී සහ ජාතික තරහකාරී ලංසු ක්‍රමයෙන් පනවා ඇති මිල සීමාවන්, ලබා ගත යුතු මිල ගණන් සංඛ්‍යාව සහ අනෙකුත් සීමා කිරීම් අභිබවා

කටයුතු කිරීමට යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය කරන අතර, එක් එක් ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

මිලදී ගත් ද්‍රව්‍ය	වටිනාකම	විගණන නිරීක්ෂණය
	රු.මිලියන	
I. යුද්ධ හමුදාවේ නිලධාරීන්/ සෙසුනිලයන් සඳහා පළඳින යුද්ධ හමුදා ලාංඡනය ඇතුළත් වන පරිදි සැකසූ නාමපුවරු 165,100 ක් මිලදී ගැනීම	132.45	i. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ රු.මිලියන 103.2 ක මුදලක් වෙන්කර තිබුණද සැලැස්ම ඉක්මවා රු.මිලියන 29.24 ක් හෙවත් සියයට 28 ක් වැයකර තිබුණි. ii. මෙම නාමපුවරු 73 වන නිදහස් දින පෙළපාලිය සඳහා සහභාගි වන සියලු නිලධාරි/සෙසුනිලයන් පැළඳිය යුතු බවට යුද්ධ හමුදාපති විසින් උපදෙස් ලබා දී තිබුණද, ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම ඇතුලු තවත් පරිපාලන ප්‍රමාදයන් හේතුවෙන් අදාළ ප්‍රසම්පාදන කටයුතු සඳහා වර්ෂයකුත් මාස 11 කට අධික කාලයක් ගත වී තිබුණු අතර, අදාළ නියෝගය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. iii. යුද්ධ හමුදාව විසින් සකස් කර තිබුණු පිරිවිතර ලේඛන අනුව නිල ලාංඡනය ඇතුළත් කොටසෙහි වර්ණ කේතයක් වෙනුවට වර්ණයක් දක්වා තිබුණු අතර තෝරාගත් සැපයුම්කරු සැපයූ සාම්පල්වල යුද්ධ හමුදා නිල ලාංඡනය අදාළ වර්ණ කේතයට අනුව නිර්මාණය කර නොමැති බව පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය දන්වා තිබියදීත් ඒ පිළිබඳව නොසළකා තාක්ෂණික පැගයීම් කමිටුව සැපයුම්කරු නිර්දේශ කර තිබුණි. iv. අඩුමිල ඉදිරිපත් කළ ලංසුකරුගේ නියැදි නාමපුවරුවල පිටුපස කොටස ඉදිරිපත්කර නොමැති බව දක්වමින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර, එම ලංසුකරු අදාළ නියැදියේ පිටුපස කොටස නැවත ඉදිරිපත් කරන බවට ලිඛිතව දන්වා තිබුණත්, අදාළ අඩු මිල ලංසුකරුගෙන් නියැදිය ලබා ගැනීමේ අවස්ථාව නොසළකා වැඩි මිල ඉදිරිපත් කළ ලංසුකරුවකු තෝරාගැනීම නිසා රු.මිලියන 51.08 ක වැඩි පිරිවැයක් දරා අදාළ ප්‍රසම්පාදනය කර ගැනීමට සිදු වී තිබුණි.

v. සැපයුම්කරු සම්පූර්ණ ඇණවුමේන් සියයට 30 ක් එකහ වූ මිලට සැපයීමෙන් අනතුරුව එකහ වූ මිලට ඉතිරි තොගය සැපයීම නොහැකි බවට දන්වා තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් යුද්ධ හමුදාව සැපයුම්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. පසුව සැපයුම්කරු යෝජනා කර තිබුණු වැඩි මිල මත ඉතිරි සියයට 70 ක පැහැරහරින ලද තොගය මෙම සැපයුම්කරුගෙන්ම අතිරේකව රු.මිලියන 34.21 ක් ගෙවා මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

II. කඳවුරු ආරක්ෂාව සඳහා Chain Link Mesh(G-10) 810 ක් මිලදී ගැනීම — 83.00

i. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පමණක් මිල ගණන් කැඳවා තිබුණු අතර, අඩු මිල ඉදිරිපත් කළ ලංසුකරු "මුදල් පදනම මත පමණක් භාණ්ඩ සැපයිය හැකි බවට" දක්වා තිබූ පිරිවිතරය හැර අනෙකුත් තාක්ෂණික පිරිවිතර සියල්ලම සපුරා තිබුණු බවත්, ණය පදනම මත භාණ්ඩ සැපයීමට එකහ නොවීම මූලික කරගෙන මෙම ලංසුකරු බැහැරකර දෙවැනියට අඩු මිල ඉදිරිපත් කළ ලංසුකරුගෙන් අතිරේකව රු.මිලියන 29.73 ක් වැඩිපුර ගෙවූ භාණ්ඩ තොගය මිලදී ගැනීමට කටයුතු කර තිබුණු අතර, ලංසු ලේඛන වලින් මුදල් ගෙවිය හැකි නිශ්චිත කාල වකවානුවක් නියමකලේ නම් ඒ සඳහා ගැළපෙන ආකාරයට මිල ගණන් ඉදිරිපත් කිරීමට ලංසුකරුවන්ට අවස්ථාව ලැබෙන අතර, ඒ අනුව කටයුතු කර මෙම අතිරේක වියදම අඩුකර ගැනීමට තිබූ අවස්ථාවන් සලකා බලා නොතිබුණි.

ii. ලංසු ලේඛනවලින් වලංගු SLS සහතික ඉදිරිපත් කළ යුතු බව සැපයුම්කරුවන්ට දන්වා තිබුණු අතර, භාණ්ඩ සැපයූ සැපයුම්කරු විසින් අදාළ භාණ්ඩවල ගුණත්වය සම්බන්ධයෙන් SLS 1148 ප්‍රකාරව තත්ත්ව සහතිකයක් ඉදිරිපත් කර තිබුණද, එම තත්ත්ව සහතිකය 2019 නොවැම්බර් 02 දිනෙන් කල්ඉකුත් වී තිබුණු. බැවින් වලංගු SLS තත්ත්ව සහතිකයක් නොමැතිව අදාළ සැපයුම ලබාගෙන තිබුණි.

III.	යුද්ධ හමුදාව විසින් ඉදිකරනු ලබන මැනිං ටවුන් විවාහක නිලධාරී නිවාස සංකීර්ණය සඳහා දහර වානේ කම්බි මිලදී ගැනීම.	71.27	i. මෙම නිලධාරී නිවස්නය ඉදිකිරීම සඳහා රු.මිලියන 25 ක වියදමින් වර්ග 09 ක දහර වානේ කම්බි මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් නිර්දේශයන් ලබාගෙන ප්‍රසම්පාදන තීරණ ගැනීමට මාස 04 ක කාලයක් ගතකර තිබුණු අතර, මේ නිසා ඇණවුම් නිකුත් කිරීමට ප්‍රමාද වීමෙන් තෝරාගත් සැපයුම්කරුවන් අදාළ යකඩ තොගය එකඟ වී තිබූ මිල යටතේ සැපයීම් ප්‍රතික්ෂේප කර තිබුණි. 8.9.1(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹ නොතිබුණු නිසා ඇණවුම් නොසැපයීමෙන් සිදු වූ හානිය යුද්ධ හමුදාවට දරා ගැනීමට සිදු වී තිබුණි. පැහැරහැරි සැපයුම්කරුවන් දෙදෙනාද ඇතුලුව සැපයුම්කරුවන් 150 දෙනෙකුගෙන් නැවත මිල ගණන් කැඳවා තිබුණු අතර, පැහැරහැරි සැපයුම්කරුවකු සහ තවත් සැපයුම්කරුවන් දෙදෙනෙකු මිල ගණන් ඉදිරිපත්කර තිබුණි. එම ලංසු ඇගයීමෙන් පසුව අඩු මිල ගණන් ඉදිරිපත් කර ඇති ලංසුකරුවන් ලෙස සළකා ඉහත පැහැරහැරි ලංසුකරුගෙන් දහර වානේ කම්බි වර්ග 5 ක් රු.මිලියන 41.12 ක මුදලකට මිලදී ගැනීමටත්, වෙනත් සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් දහර වානේ කම්බි වර්ග 4 ක් රු.මිලියන 10.56 කට මිලට ගැනීමටත් කටයුතු කර තිබුණු අතර, මෙම අවස්ථාවලදී ද 8.9.1(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් ගතවීමක් සිදුකර නොතිබුණි. කෙසේ වෙතත් අදාළ දහර වානේ කම්බි සඳහා සැපයුම්කරුවන් විසින් පළමුව ඉදිරිපත් කළ මිල ගණන්වලට වඩා මෙම අවස්ථාවේ ඉදිරිපත් කර ඇති මිල ගණන් රු.මිලියන 28.3 කින් හෙවත් සියයට 123 කින් ඉහළ මිල ගණන් වූ අතර, පළමු මිල ගණන් කැඳවීමේදී සැපයුම්කරුවන් විසින් ලබාදුන් දින 90 ක මිල වලංගු කාලය තුළ ඇණවුම් නිකුත් කිරීමට නොහැකි වීමෙන් මෙම මුදල අතිරේකව දැරීමට සිදු වී තිබුණි.

ii. එකවර මිලදී ගැනීමෙන් ලබා ගත හැකිව තිබූ වට්ටම් සහ මිල වාසිය ගැන අවධානය යොමු නොකොට යථෝක්ත කම්බි තොගය මාස තුනකට අඩු කාල පරිච්ඡේදයක් තුළ අවස්ථා තුනකදී රු.මිලියන 42.95 ක්, රු. මිලියන 8.02 ක් හා රු. මිලියන 20.30 ක් වශයෙන් මිලදී ගෙන තිබුණි.

IV. ජංගම වෛද්‍ය පරීක්ෂණ කාමරයක් හා ජංගම ෆාමසියක් සහිත බස් රථයක් සහ ජංගම රසායනාගාර පහසුකම් සහිත බස් රථයක් මිලදී ගැනීම	38.51	i. 2018 ජූලි 16 දිනැති අංක 03/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධාන පරිදි ජංගම වෛද්‍ය පරීක්ෂණ කාමරයක් හා ජංගම ෆාමසියක් සහිත බස් රථයක් සහ ජංගම රසායනාගාර පහසුකම් සහිත බස් රථයක් පිළිවෙලින් රු.මිලියන 7.23 හා රු.මිලියන 5.35 ක් වශයෙන් එකතුව රු.මිලියන 12.58 ක සීමාවකට යටත්ව මිලදී ගතයුතු බවට දැනුම්දී තිබුණද, පිළිවෙලින් රු.මිලියන 15.28 ක් රු.මිලියන 23.23 ක් ලෙස එකතුව රු.මිලියන 38.51 ක් වැයකර මිලදී ගෙන තිබුණි. ඒ අනුව අනුමත සීමාව සියයට 206 හෙවත් රු.මිලියන 25.94 කින් ඉක්මවා තිබුණි. තවද, ඇස්තමේන්තුගත අනුමත සීමාවන් ඉක්මවීම පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා මඟින් පෙන්වාදී තිබුණද, ඒ පිළිබඳව නොසළකා ඇස්තමේන්තු සීමා සංශෝධනයකින් තොරව, අදාළ බස් රථ 02 ක මිලදී ගැනීමට කටයුතු කර තිබුණු අතර, 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි මෙම බස් රථ 02 ක රු.මිලියන 13 ක ඇස්තමේන්තු වටිනාකම මත මිලදී ගැනීමට සැලසුම්කර තිබුණි. ii. 2021 දෙසැම්බර් 06 දින භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2021 මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට පූර්ව ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන දළ වශයෙන් වෙන්කර තැබිය යුතු බවත්, භාණ්ඩාගාරය විසින් ඒ ඒ කාර්තුව සඳහා බැඳීම් ඇති කර ගැනීම වෙනුවෙන් අනුමැතිය ලබාදී ඇති සීමාවන් සහ නිදහස් කෙරෙන අක්මුදල් ප්‍රමාණය පිළිබඳවද අවධානය යොමුකර එම සීමාවන් නොඉක්මවන පරිදි බැඳීම් ඇතිකර ගැනීමට කටයුතු කළයුතු බවත් දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

iii. අදාළ බස් රථ දෙක වෙන වෙනම ලිපිගොනු යටතේ එකම කාල පරිච්ඡේදය තුළ ප්‍රසම්පාදනයන් දෙකක් ලෙස ක්‍රියාත්මක කර එකම පුද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර, එකවර ප්‍රසම්පාදනය කිරීමේදී ලබාගත හැකිව තිබූ මිල වාසිය හා ප්‍රසම්පාදන වියදම් සළකා බලා නොතිබුණි.

iv. 2.3.2 (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර ඇතුලු ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම සහ ඒවා සමාලෝචනය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමටත්, 5.3.1(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර හා ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කිරීමටත් හැකිවන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මුල් අදියරේදී තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීමට ක්‍රියාකර නොතිබූ අතර, මුල් වරට ලංසු කැඳවීමෙන් මාස 06 කට අධික කාලයක් ගතවීමෙන් පසුව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි.

v. යුද්ධ හමුදාවේ වෛද්‍ය කටයුතු වඩාත් කාර්යක්ෂමව හා උසස් අන්දමින් පවත්වා ගැනීම සඳහාත්, දිවයින තුළ සිදුවන ස්වභාවික ව්‍යසන, වසංගත රෝග හා විශේෂ ආරක්ෂක රාජකාරිවලදී යුද්ධ හමුදා සාමාජිකයින්ට අමතරව සිවිල් ජනතාව වෙනද වෛද්‍ය සේවාවන් විධිමත්ව ඉටුකිරීම සඳහාත් යන අරමුණු ඇතිව මිලදී ගෙන 2022 මැයි මාසයේ යුද්ධ හමුදා රෝහලට අනුයුක්ත කර තිබුණු මෙම බස්රථ දෙකෙන් වෛද්‍ය පරීක්ෂණ කාමරයක් හා ෆාමසියක් සහිත බස් රථය ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 180 ක් හා ප්‍රතිකාර ලැබූ රෝගීන් ප්‍රමාණය 248 ක්ද පරීක්ෂණය සඳහා යොදාගෙන තිබුණේ එක් දිනයක්ද වන අතර, රසායනාගාර ජංගම බස් රථය ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 240 ක්ද ප්‍රතිකාර ලැබූ රෝගීන් ප්‍රමාණය 805 ක්ද පරීක්ෂණය සඳහා යොදාගත් දින ගණන 03 ක්ද වූයෙන් සමාලෝචිත වර්ෂයේ මෙම බස් රථවල උපයෝජනය ඉතා අඩු මට්ටමක පැවතුණි.

V.	නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රයේ මහල් 15 ක ගොඩනැගිල් ඉදිකිරීම සඳහා අවශ්‍ය පෙරමුසු කොන්ක්‍රීට් මිලදී ගැනීම	277.37	5.4.10 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණයක්, 5.3.11 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණක් ලබාගෙන නොතිබුණු අතර, 8.9.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරු සමඟ ගිවිසුම් ගතවීමක්ද සිදුකර නොතිබුණි. ලිපිගොනු 09 ක් යටතේ 2019 මැයි මාසයේ සිට 2022 අප්‍රේල් මාසය දක්වා ඇණවුම් කළ රු.මිලියන 112.82 ක් වටිනා පෙරමුසු කොන්ක්‍රීට් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සැපයුම්කරුවන් සපයා නොතිබුණු අතර, ඉහත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා පැහැරහරින ලද මෙම කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් යුද්ධ හමුදාවට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.
VI.	අඟුණුවැල්පැලැස්ස ප්‍රදේශයේ ඉදිකරනු ලබන වෙඩි ද්‍රව්‍ය ගබඩා සඳහා අවශ්‍ය පෙරමුසු කොන්ක්‍රීට් මිලදී ගැනීම	57.10	i. 8.9.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් ගත වීමක් සිදුකර නොතිබුණු අතර, මේ නිසා රු.මිලියන 14.13 ක වටිනාකමින් යුත් පෙරමුසු කොන්ක්‍රීට් සැපයුම්කරුවන් සපයා නොතිබීම සම්බන්ධයෙන් යුද්ධ හමුදාවට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. ii. පෙරමිශ්‍ර කොන්ක්‍රීට් 472 m^3 ක් මිලදී ගැනීම සඳහා 2022 ජනවාරි 13 දින ආයතන 80 කින් මිල ගණන් කැඳවා තිබුණත්, මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ එක් ආයතනයකින් බැවින් එම මිල ගණන් ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව කළ නිර්දේශයෙන් බැහැරව සේවාවේ හදිසි අවශ්‍යතාවය මත ඉදිරිපත් වූ එකම මිල ගණන මත අදාළ ප්‍රසම්පාදන සිදු කරවා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණයකර හාණ්ඩ ඇණවුම් කර තිබුණද, 2022 නොවැම්බර් මාසය අවසානය වන විටත්, සැපයුම්කරු සපයා තිබුණේ පෙරමුසු කොන්ක්‍රීට් 70 m^3 පමණක් වන අතර, ඉතිරි 401 m^3 ප්‍රමාණය සැපයීම් පැහැරහැර තිබුණි.

VII. යුද්ධ හමුදාවේ මධ්‍යම ඉංජිනේරු සේවා හබරකඩ වැඩපළ සඳහා අලුත්වැඩියා උපකරණ මිලදී ගැනීම	12.41	5.4.10 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක්, 5.3.11 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණක් හෝ 8.9.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරු සමඟ ගිවිසුම්ගත වීමක් සිදුකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම රු.මිලියන 5.21 ක් වටිනා ඇණවුම් කළ අමතර කොටස් සැපයුම්කරුවන් සපයා නොතිබුණි. ඉහත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා පැහැරහරින ලද මෙම කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් යුද්ධ හමුදාවට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.
VIII. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලිපිගොනු 05 ක් යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම .	20.71	8.9.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමක් සිදුකර නොතිබුණු අතර, මේ නිසා රු.මිලියන 3.3 ක වටිනාකමින් යුත් ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයුම්කරුවන් සපයා නොතිබීම සම්බන්ධයෙන් යුද්ධ හමුදාවට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.
IX. පනාගොඩ 1වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව විසින් පයිප්ප, දහර වානේ, විදුලි රැහැන් ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම.	7.85	රු.3.89 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී 6.2.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ලබා දීමට අවම දින 07 ක කාලයක් ලබා දිය යුතු වුවද, ලංසු කැඳවූ දිනට පසු දිනම ලංසු විවෘතකර තිබුණි.

3.2.2.2 ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදුකළ ප්‍රසම්පාදනයන්

ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදු කරන ලද එකතුව රු.මිලියන 149.22 ක මිලදී ගැනීම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන කරුණු පහත දැක්වේ.

මිලදී ගත් ද්‍රව්‍ය	වටිනාකම	විගණන නිරීක්ෂණ
	රු. මිලියන	
I. යුද්ධ හමුදාවේ ගුවන් සංක්‍රමික බලසේනාව සඳහා Uniform Rib Stop Olive Green Kit 4500 ක් මිලදී ගැනීම.	70.47	i. ලංසු ලේඛන 03 ක් ලංසුකරුවන් රැගෙන ගියද මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ එක් ලංසුකරුවකු පමණක් වන අතර, 6.3.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු නොකර ලංසු විවෘත කිරීමට නියමිත දිනයට සති දෙකකට පසු ලැබුණු මෙම ලංසුව භාරගෙන තිබුණු අතර, අදාළ නිල ඇඳුම් සියයට සියයක්ම Cotton අමුද්‍රව්‍යයෙන් නිමකරන ලද රෙදිවලින් සමන්විත විය

යුතු බවට පිරිවිතර ලේඛනවලින් දක්වා තිබීම හේතුවෙන් එම රෙදි නොමැති වීම මත ලංසු ලේඛන රැගෙන ගිය අනෙකුත් ලංසුකරුවන් දෙදෙනා මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි. මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු සියයට 45 ක් Polyester හා සියයට 55 Cotton වර්ගයේ රෙදිවලින් නිෂ්පාදිත නිල ඇඳුම් සැපයිය හැකි බවට මිල ගණන් සමඟ දන්වා එවා තිබුණු අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව මෙම රෙදිවලින් යටෝක්ත නිල ඇඳුම් නිපදවිය හැකි බවට නිර්දේශයන් ලබාදී එම වර්ගයේ රෙදි මෙම ලංසුකරුගෙන් මිලදී ගැනීම සිදුකර තිබුණි. ලංසු ලේඛන රැගෙන ගිය තරහකාරී අනෙකුත් ආයතන දෙකට සියයට 45 ක් Polyester හා සියයට 55 Cotton ලෙස පිරිවිතර ලේඛනවල Fabric Composition යන පිරිවිතරය වෙනස් කරන බවට දැනුම් දීමක් සිදුකර නොමැති අතර, සියයයට 45 ක් Polyester හා සියයට 55 Cotton වර්ගයේ රෙදිවලින් අදාළ යෝග්‍ය නිල ඇඳුම් නිපදවිය හැකි නම් මිල තරහයෙන් ලංසුකරුවන් ඉවත් කිරීම සඳහා මෙම රෙදි මිලදී ගැනීමට අදාළ මූලික පිරිවිතර ලේඛන පිළියෙල කිරීමේදී සියයට සියයක් Cotton ලෙස ඉල්ලා සිටීම සිදුකර ඇති බවට නිරීක්ෂණය කෙරේ.

ii. සැපයුම්කරුගේ සාම්පල් යුද්ධ හමුදාව ඉල්ලුම් කරන ලද පිරිවිතරයක් වූ Fabric Yan Count (Warp Way) අගය 2 / 40 ± සියයට 5 ක් වුවත් පවතින එම අගය සියයට 17 ක් බවට පර්යේෂණාගාර වාර්තාවලින් දක්වා තිබූ බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව මෙම රෙදි සුදුසු නොවන බවට පළමුව නිර්දේශ කර නැවත මිල ගණන් කැඳවන ලෙසට දන්වා තිබුණි. පසුව එම තීරණය වෙනස්කර ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසු යෝග්‍යතාවය වාර්තා කරන ලෙස නිර්දේශ කර තිබුණු අතර, එම ක්ෂේත්‍ර පරීක්ෂාවේ ප්‍රතිඵල මත නිර්දේශයන් ලබා දී තිබුණි.

iii. මෙම නිල ඇඳුම් භාවිතා කරන ගුවන් සංක්‍රමික බල සේනාව විසින් අදාළ ඇඳුම් කට්ටලයට අඩංගු කැප් වල (Cap) හැඩය උචිත නොවන බවට වාර්තා කර තිබුණද, එම තත්ත්වය නොසළකා අදාළ මිලදී ගැනීම සිදුකර තිබුණි.

iv. අදාළ නිමි ඇඳුම් තොගය අවස්ථා 03 කදී වෙයන්ගොඩ යුද්ධ හමුදා ඇඳුම් ගබඩාව වෙත භාරදී නිබුණු අතර, ඉන් අවස්ථා 02 කදී සපයා තිබූ රු.මිලියන 60.09 ක් වටිනා නිමි ඇඳුම් තොගවල වර්ණයන් යුද්ධ හමුදාවට මිලදී ගැනීමට එකඟවූ වර්ණයට වඩා වෙනස්ව සපයා ඇති බව තත්ත්ව ආරක්ෂණ හා පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලය දන්වා නිබුණු අතර, එම තත්ත්වය නොසළකා අදාළ රෙදි තොගය භාරගෙන නිබුණි.

II. නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා ඇඟ උණුසුම් කිරීමේ ඇඳුම් මැසීම සඳහා සුදු පැහැති Tricot වර්ගයේ අඟල් 60 පළල 240 gsm රෙදි මීටර් 25,000 ක් මිලදී ගැනීම.	11.25	රෙදි මිලදී ගැනීමට පෙර සැලසුම්කර නිබුණු පරිදි පර්යේෂණාගාර වාර්තාවක් ලබාගෙන නොනිබුණු අතර, තාක්ෂණික ඇඟයීම් කමිටු සභාපතිවරයා විසින් ක්ෂේත්‍ර පරීක්ෂාව/දෘශ්‍ය පරීක්ෂණ වාර්තාවක් සකස්කර නිබුණි. එම වාර්තාවේ I වන සේදීම, II සේදීම හා යන්ත්‍රානුසාරයෙන් III වන සේදීමේදී අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද රෙදි සාම්පල්වල වෙනස්වීම් පිළිබඳ වාර්තා කර නිබුණු අතර, රු.මිලියන 4.98 ක අවම මිලක් ඉදිරිපත් කළ සැපයුම්කරුගේ සාම්පල මෙම වාර්තාව පදනම්ව I සේදීමෙදී Color Fastness වල දෘෂ්ඨී වෙනසක් නොමැති බවත්, රෙදි මැදිමෙදී සුළු වෙනසක් ඇති වන අතර, II වන වර සේදීම හා යන්ත්‍රානුසාරයෙන් III වර සේදීමේදී ද එම තත්ත්වයන් නිරීක්ෂණය වූ බව වාර්තා කර ඇති අතර, රෙදි මැදිමේදී ඇති වූ සුළු විචලතාවය අදාළ වාර්තාවේ වැඩි දුරටත් විස්තර කර නොතිබුණි. අදාළ පරීක්ෂණාගාර වාර්තා ලබා නොගෙන මෙම කරුණු මත පදනම්ව අඩු මිල ලංසුකරු බැහැර කිරීම සඳහා පාදක කරගත් කරුණු ප්‍රමාණවත් නොවන අතර, එම ලංසුකරුගෙන් මෙම රෙදි තොගය මිලදී ගත්තේ නම් රු.මිලියන 6.28 ක් රජයට ඉතිරිකර ගත හැකිව තිබුණි.
III. මේජර් ජනරාල්, බ්‍රිගේඩියර් හා කර්නල් නිලයන් සඳහා නිල අඳුම් කට්ටල 450 ක් මිලදී ගැනීම.	17.14	i. ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන් 173 ක ගෙන් විද්‍යුත් කැපැල හරහා මිල ගණන් කැඳවීම සිදුකර නිබුණු අතර, එම අවස්ථාවේදී කිසිදු සැපයුම්කරුවෙකු ප්‍රතිචාර දක්වා නොතිබුණු බැවින් නැවත වරක් එම ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන්ම මිල ගණන් කැඳවීම සිදුකර නිබුණත් එම අවස්ථාවේදී ද ලැබී නිබුණේ එක් මිල ගණනක් පමණි. වර්ණ කේත හා මිණුම් නිවැරදිව පිරිවිතර ලේඛන මඟින් දක්වා නොතිබීම නිසා සැපයුම්කරුවන් මිලගණන් ලබා දීමට ඉදිරිපත් වී නොමැති බවට විගණනයට කරුණු අනාවරණය වී ඇති අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව

		යුද්ධ හමුදා පිරිවිතර හා සම්පූර්ණයෙන් එකඟවන සාම්පල්/නිදර්ශක නොතිබුණද, එම සැපයුම්කරුගෙන් මිලදී ගැනීම සිදු කිරීමට තීරණය කර තිබුණි. ii. රු.මිලියන 14.72 ක් වැය කරමින් Cloth Rib –Stop Black CR/SF Pattern 58/60" 25,000 Meters ක් මිලදී ගැනීමේදී එක් ලංසුකරුවකුගෙන් රු.98,650 ක් බැගින් තත්ත්ව පරීක්ෂණ ගාස්තු අයකරගෙන තිබුණු අතර, එවැනි තත්ත්ව පරීක්ෂණයක් සිදු කිරීමකින් තොරව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ක්ෂේත්‍ර පරීක්ෂාවක් හා දෘශ්‍ය පරීක්ෂාවක් සිදුකළ බවට සඳහන් කළද එවැනි පරීක්ෂාවන් කළ බවට වාර්තාවන් නොතිබුණු අතර, කිසිදු පිළිගත හැකි පරීක්ෂණ වාර්තාවකින් තොරව සැපයුම්කරු තෝරාගෙන තිබුණි.
IV. යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා Cap Peak Brown Chin Trap Gold and Silver Button 1600 ක් මිලදී ගැනීම.	50.36	යුද්ධ හමුදාව විසින් පිරිවිතර ලේඛනයක් ඉදිරිපත් කර ඇතත්, එම පිරිවිතර ලේඛනයෙන් ප්‍රධාන විෂයගත කරුණු සම්බන්ධයෙන් නිශ්චිත පිරිවිතර ප්‍රමාණාත්මකව ඉදිරිපත් කර නොතිබුණි. නමුත් ලංසු අගයන අවස්ථාවේදී මෙම ප්‍රධාන විෂයගත කරුණුවලට අදාළ නිශ්චිත පිරිවිතර යොදාගෙන ඇගයීම් කටයුතු සිදුකිරීම නිසා 7.7 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන වලින් බැහැරව ලංසු ඇගයීම සාධාරණත්වයෙන් බැහැරව සිදුකර තිබුණි. මේ නිසා රු.මිලියන 13.04 ක වැඩි වැයබරක් දරමින් අදාළ නිලඇදුම් ආයිත්තම් ප්‍රසම්පාදනය කරගෙන තිබුණි.

3.2.2.3 මිල සැඳැහුම් ක්‍රමය යටතේ සිදුකළ ප්‍රසම්පාදනයන්

මිල සැඳැහුම් ක්‍රමය යටතේ සිදු කරන ලද එකතුව රු.මිලියන 40.83 ක මිලදී ගැනීම් සම්බන්ධයෙන් පොදුවේ නිරීක්ෂණය කරන කරුණු පහත දැක්වේ.

(අ) මිල ගණන් ඉල්ලීම් ලේඛන අදාළ ආයතන වෙත ලැබුණු බවට සනාථ කරගෙන නොතිබුණු නිසා මෙම ලේඛන සැපයුම්කරුවන් වෙත නිශ්චිතවම ලැබුණේද යන්න මතභේදාත්මක වන අතර, අදාළ ලේඛන තැපැල් මාර්ගිකව යවා ඇත්ද, අතින් ගෙනවිත් භාරදී ඇත්ද, හෝ වෙනත් ක්‍රමයක් අනුගමනය කර ඇද්ද යන්න සනාථ කෙරෙන ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද, මිල ගණන් ඉල්ලුම් කරන ලද සැපයුම්කරුවන් සතුව අදාළ භාණ්ඩ අයිතම් තොග පවතීද යන්න නිශ්චිතව සොයා බැලීමකින් තොරව මිල ගණන් ඉල්ලුම් කිරීම නිසා ලියාපදිංචි සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයකගෙන් මිල ගණන් ඉල්ලා තිබුණද, ලැබුණු මිල ගණන් ප්‍රමාණය බොහෝ විට දහයකටත් අඩු සංඛ්‍යාවක් විය.

(ආ) ඇතැම් මිලදී ගැනීම් වලදී එක් එක් සැපයුම් කාණ්ඩ සඳහා සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයක් ලියාපදිංචි වී සිටියද ඉතා සීමිත සැපයුම්කරුවන් ප්‍රමාණයකගෙන් මිල ගණන් විමසා තිබුණු අතර, මෙම මිල ගණන් විමසූ සැපයුම්කරුවන් තෝරාගත් පදනමද විගණනයට අනාවරණය නොකෙරුණි.

එක් එක් ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

	මිලදී ගත් ද්‍රව්‍ය	වටිනාකම	විගණන නිරීක්ෂණ
		රු.මිලියන	
I.	17 වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා රෙජිමේන්තුව - දියතලාව විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම	22.52	2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා එහි 35 වන සංශෝධනය පරිදි ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් යොදවා සිදුකරනු ලබන ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු විසින් අනුමැතිය ලබාදුන් වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදුකළ යුතු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ලබාදී ඇති මූල්‍ය සීමාව රු.මිලියනයක හෝ ඊට අඩු විය යුතු වුවද මෙම ප්‍රසම්පාදනයන් 21 කදී එම උපරිම මූල්‍ය සීමාව ඉක්මවා කටයුතු කර තිබුණි.
II.	කොම්පඤ්ඤවිදිය විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපොළ සඳහා වාහන අමතර කොටස් මිලදී ගැනීම	18.31	i. 3.4 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නිර්ණායකයන් අනුව කටයුතු නොකර ආරක්ෂක අමාත්‍යාංශයේ වාහන හා යන්ත්‍ර අමතර කොටස් සැපයීම සඳහා 2022 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සැපයුම්කරුවන් පස්දෙනෙකු බැගින් තෝරාගෙන යුද්ධ හමුදා සාමාජිකයෙකු විසින් ව්‍යාපාරික ස්ථාන වෙත ලංසු ලේඛන අතින් ගෙනගොස් මිල ගණන් ලබාගෙන තිබුණි. තවද, 6.2.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමයේදී මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන්ට ලබාදිය යුතු අවම කාල සීමාව ලබා දී නොතිබුණු අතර, එම කාලය දිනකට හෝ දෙකකට සීමාකර තිබුණි. ii. මිලදී ගන්නා ලද අමතර කොටස් හෝ උපකරණ සවිකර අලුත්වැඩියාව නිමකල දිනයෙන් පසුව රු.මිලියන 1.07 ක අමතර කොටස් හා උපකරණ මිලදී ගැනීමට අදාළ ඉන්වොයිස් දිනයන් මාස 01 සිට මාස 08 දක්වා පසු දිනයන් බව නිරීක්ෂණය විය.

3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පනාගොඩ ඉංජිනේරු සේවා රෙජිමේන්තු ගබඩාවේ රු.මිලියන 2.09 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය 119 කට අදාළව අයිතමයන් 15,237 ක ප්‍රමාණයක් වර්ෂ 04 අධික කාලයක සිට නිකුත් නොකර පැවතීම නිසා ඒවායේ ආර්ථික ඵලදායිතාවය බෙහෙවින් හීන වී තිබුණු අතර, රු.මිලියන 2.56 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීම් උපකරණ අයිතම 39 ක් සම්පූර්ණ වගකීම් කාලය ඉක්මවන පරිදි නිකුත් නොකර රඳවාගෙන තිබුණි. තවද, වර්ෂයක පමණක් වගකීම් කාලයක් ඇති රු.මිලියන 13.43 ක් වටිනා උපකරණ වර්ග 21 කට අයත් අයිතම 185 ක වගකීම් කාලය මාස 08 සිට මාස 11 ක් දක්වා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව ගබඩාව තුළ නිෂ්කාර්යව තිබුණු අතර, රු.427,544 ක් වටිනා ජල පොම්ප 17 ක් වර්ෂ 02 කට ආසන්න කාලයක් ගබඩා තුළ නිෂ්කාර්යව තබා තිබුණි.

(ආ) 1998 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදීගත් රු.මිලියන 4.33 ක් වටිනා වාහන සහ අනෙකුත් උපකරණ කොටස් වර්ග 216 කට අයිතම 1,888 ක් හා වටිනාකම් අනාවරණය නොකෙරුණු අමතර කොටස් වර්ග 37 කට අදාළව අයිතම 838 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට නොගෙන කොම්පඤ්ඤවීදිය විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපොළ ගබඩාවේ පැවතුණි.

(ඇ) යුද්ධ හමුදාවට අයිති වාහන 1,320 ක් සඳහා සහ යුද්ධ හමුදාව පරිහරණය කරමින් පවතින ධාවන තත්තවයේ ඇති වාහන 1,839 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදීද, රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණු අතර යුද්ධ හමුදාවට වෙනත් ආයතනවලින් ලැබී ධාවන තත්වයේ පවතින වාහන 42 කට අදාළ රක්ෂණ ආවරණද ලබාගෙන නොතිබුණි.

(ඈ) විධිමත්ව පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාව විසින් වෙනත් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුලු රජයේ තවත් ආයතනවලට අයත් ට්‍රක් රථ 32 ක්ද, ගිලන්රථ 17 ක්ද, ට්‍රැක්ටර් 11 ක්ද , කැඩි රථ 11 ක්ද, ජීප් රථ 5 ක්ද, ට්‍රැක්ටර් වෙලර් 4ක්ද, ජල හා ඉන්ධන බවුසර් 04 ක්ද, බස්රථ 3 ක්ද, ටිපර් රථයක්ද, අණ හා මාණ්ඩලික රථයක් හා යතුරුපැදි 8 ක්ද පරිහරණය කරමින් පවති.

3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ අනාවරණය කර ඇති අලාභ හානි සිද්ධි වලින් වසර 10 කට වැඩි සිද්ධි 88 කට අදාළව රු.මිලියන 197.22 ක අලාභයක්ද, වසර 05 ට වැඩි වසර 10 ට අඩු සිද්ධි 166 කට අදාළව රු.මිලියන 12,933.89 ක අලාභයක්ද වසර 05 ට අඩු සිද්ධි 222 කට අදාළව එකතුව රු. මිලියන 324.76 ක අලාභයක්ද, 1990 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සිදු වූ රිය අනතුරු 181 ක්ද පැවති අතර, මෙම අලාභ හානි අයකර ගැනීමට හෝ කපා හැරීමට විගණන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කම් කළමණාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය ලේඛන අනුව යුද්ධ හමුදාවේ ස්ථාවර වත්කම් වර්ග 69 කට සිදු වූ රු.මිලියන 733.76 ක අලාභ හානි පොත් වලින් කපා හැර තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයේ (ඇමුණුම් අංක ii) මෙම කපාහල අගයන් ඇතුළත් කර නොමැති අතර, ඒ අනුව කපා නොහල ඉදිරියට ගෙනා ශේෂයද, එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙන්ද (ඒසිඒ- 6) ද මෙම කපාහල වත්කම්වල අගය ඉවත් කර නොතිබුණි.

(ඇ) 2021 වර්ෂ අවසානයේ කපා නොහල ශේෂයන් ලෙස ඉදිරියට ගෙන එන ලද අයිතම 252 කට අදාළව එකතුව රු.මිලියන 846.46 ක ශේෂයන් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද (ඇමුණුම ii) පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයේ කපා නොහල ආරම්භක ශේෂ ලෙස වාර්තා කර නොතිබුණු අතර, 2021 මූල්‍ය ප්‍රකාශන මඟින් වර්ෂ අවසානයට කපා නොහල අවසාන ශේෂ ලෙස දක්වා නොතිබුණු අලාභ හානි සිද්ධීන් 106 කට අදාළව රු.මිලියන 252.18 ක ශේෂයන් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් ලෙස දක්වා තිබුණි. තවද, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයේ අලාභ හානි සිද්ධි 17 කට අදාළව කපා නොහල වර්ෂ අවසාන ශේෂයන් රු.මිලියන 29.43 ක් වැඩියෙන්ද, අලාභ හානි සිද්ධි 05 කට අදාළව කපා නොහල ඉදිරියට ගෙන එන ලද එකතුව රු.මිලියන 11.13 ක ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක කපා නොහල ශේෂයන් ලෙස අඩුවෙන්ද ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද (ඇමුණුම ii) පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යුද්ධ හමුදාවේ වත්කම් වර්ග 52 කට සිදුවූ එකතුව රු.මිලියන 24.02 ක අලාභ හානි හෙළිදරවු කර නොතිබුණි.

(ඉ) 1990 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගත වූ වර්ෂ 30 ක කාලපරිච්ඡේදයේදී යුද්ධ හමුදාවේ වාහන වලට සිදුවූ රිය අනතුරු 496 ක් සම්බන්ධයෙන් 2023 මැයි 24 දින වන විටත් ක්‍රියාමාර්ග අවසන්කර ගොනු වසා දැමීමට හැකි වී තිබුණේ රිය අනතුරු 190 ක් සම්බන්ධයෙන් පමණක් වන අතර, ගොනු 306 ක ක්‍රියාමාර්ග අවසන්කර ගොනු වසා දැමීමට අපොහොසත් වී තිබුණි.

3.5 මතභේදාත්මක ගණුදෙනු

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

යුද්ධ හමුදාවට සැපයුම් හා සේවා ලබාදීම වෙනුවෙන් පුද්ගලික ආයතන 07 කට 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 137.15 ක මුදලක් ලබා දිය යුතු බවට අදාළ ආයතන විසින් විගණනයට සෘජු සනාථනයන් ලබාදී ඇති අතර, යුද්ධ හමුදාවට එම වටිනාකමට අදාල සැපයුම් හා සේවා වෙනුවෙන් එම ආයතනවලින් බිල්පත් ඉදිරිපත් නොකල බව යුද්ධ හමුදාව විසින් විගණනයට වාර්තා කර තිබුණි.

3.6 අනාර්ථික ගනුදෙනු

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

දියතලාව, පනාගොඩ හා අනුරාධපුරය යුද්ධ හමුදා කඳවුරුවලට අනුයුක්ත ගබඩා සඳහා මිලදී ගත් රු.මිලියන 5.39. වටිනා කවර් අඩුවස් 218 ක්, වාහන බැටරි 80 ක් හා විවිධ කාර්යාල හා විදුලි උපකරණ, වගකීම් කාලය තුළ ප්‍රයෝජනයට නොගැනීම නිසා පාවිච්චියට නුසුදුසු තත්ත්වයට පත්වීමෙන් අපහරණය කිරීමට සිදුව තිබුණි.

3.7 කළමණාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ කොටුවේ පැරණි යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි ඖෂධ ගබඩා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම හේතුවෙන් ඖෂධ ගබඩාව වේරහැර යුද්ධ හමුදා රෝහල ආසන්න ගොඩනැගිල්ලක් තුළ ස්ථාපිත කර තිබුණු අතර, මෙම ගොඩනැගිල්ල ඖෂධ ගබඩා කිරීම සඳහා නිබිය යුතු සෞඛ්‍ය අමාත්‍යාංශ සහ ඖෂධ නියාමන අධිකාරියේ හා අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව සකස්කර නොතිබුණි. ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14450 ක ගබඩා ගොඩනැගිල්ලක් මෙම පරිශ්‍රයේම ඉදිකිරීමට සැලසුම් කර තිබුණද, එම අවශ්‍යතාවය 2023 මැයි 30 දින වන විටත් සම්පූර්ණ කර ගැනීමට යුද්ධ හමුදාව අපොහොසත් වී තිබුණි.

(ආ) 2016 මැයි 11 දිනැති අංක අමප/16/0738/703/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සාම සාධක රාජකාරීන් සඳහා මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට නියමිත 685 ක භට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුළදී මිලදී ගෙන තිබුණු අතර, මෙම මිලදීගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් රු.බිලියන 1.38 ක් වටිනා ප්‍රවාහන හා උපකරණ තොග යුධ හමුදාවට අයත් විවිධ ප්‍රදේශවල ප්‍රධාන ගබඩා කිහිපයක ගබඩා කර තිබුණි. දිවයිනේ තවත් ස්ථාන කිහිපයක සාම සාධක රාජකාරී සඳහා මිලදී ගන්නා ලද වාහන, උපකරණ හා භාණ්ඩ යුධ හමුදාවට අයත් ප්‍රධාන ගබඩා කිහිපයක ගබඩා කර ඇතත්, එම භාණ්ඩ ගබඩා කර ඇති නිශ්චිත ස්ථාන හෝ එම වාහන, උපකරණ හා භාණ්ඩවල වටිනාකම් විගණනයට අනාවරණය කර නොතිබුණි.

(ඇ) වාර්ෂිකව රු.මිලියන1.74 ක් වැයකර මඩකලපුව දිස්ත්‍රික්කයේ අක්කර 5.74 කට අයත් බිම් කොටස් 39 ක් නිවාස හෝ ගබඩා ඉදිකිරීම් සඳහා කුලී පදනම් මත 1990 වර්ෂයේ සිට ලබාගෙන ඇති අතර, මේ වන විටත් දීර්ඝ කාලයක් රජයේ මුදල් වලින් කුලී මුදල් ගෙවා ඇතත්, මෙම කුලී ඉඩම් වෙනුවට භාවිතයට ගත හැකි රජය සතු වෙනත් ඉඩම් හෝ ගොඩනැගිලි සපයාගැනීම් සඳහා මෙතෙක් අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) දිවයිනේ විවිධ ප්‍රදේශවලින් නවාතැන් පහසුකම්, කාර්යාල හා ගබඩා පහසුකම් සලසා ගැනීම් සඳහා වාර්ෂිකව රු.මිලියන 187 ක් වැයකර වර්ග අඩි 226,160 ක ගොඩනැගිලි 39 ක් කුලී පදනම් මත යුද්ධ හමුදාවට ලබාගෙන තිබුණු අතර, වර්ෂ 30 කට අධික කාලයක සිට කුලියට ගත් ගොඩනැගිලිද විය. මෙම කුලී ගොඩනැගිලි වෙනුවට රජයේ ගොඩනැගිලි හෝ වාසස්ථාන සපයා ගැනීම් කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

4. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක්, තෘතීක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 60 ක් ඇතුළු සමස්ත පුරප්පාඩු 2,171 ක්ද, යුද්ධ හමුදා කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා ප්‍රාථමික, ද්විතීක, තෘතීක මට්ටමේ පුරප්පාඩු 32,599 ක් පවතින අතර, මීට ගැලපෙන ආකාරයට අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ පදාළ පුරප්පාඩු පිරවීමට 2023 අප්‍රේල් 30 දිනවන තෙක් කටයුතු කර නොතිබුණි.

ජේ. සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට